# ☭ නියමුවා

> "සමාජවාදය සඳහා අවශ්‍ය ආර්ථික කොන්දේසි මෝරා නොමැති නම්, කිසිම කැරැල්ලකට සමාජවාදය ඇති කළ නොහැකිය. නමුත්, අධිරාජ්‍යවාදය සමාජවාදී විප්ලවයේ පූර්වාසන්නය වන්නේ රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමය යනු සමාජවාදය සඳහා අවශ්‍ය සම්පූර්ණ ද්‍රව්‍යමය සූදානම් කිරීම වන හෙයිනි. එය සමාජවාදයට පිවිසෙන එළිපත්ත වන බැවිනි."
>
> ලෙනින්
> තෝරාගත් කෘති,
> 05 වැනි වෙළුම, 263 පිටුව

ISSN 1391 - 1031 | 2022 සැප්තැම්බර් | 27 වෙළුම | 04 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=

# ජනපීඩක ආණ්ඩුව පරදවමු!

## මැතිවරණයක් ඉල්ලා උද්ඝෝෂණ දිගටම




'අරගලයේ ජන බලය' නුගේගොඩ ජන රැලිය
2022.08.20

වේගයෙන් ඉහළ යන උද්ධමනය හමුවේ ජනතාව පීඩනයට පත්වීමට ඉඩහරින සහ එම පීඩාවන්ට එරෙහිව අරගල කරන ජනතාවට මර්දනය කැඳවන රනිල් - රාජපක්ෂ ආණ්ඩුව වහා පරාජය පත්කළ යුතුව ඇති බැවින් වහා මැතිවරණයක් පවත්වන ලෙසට බලකරමින් ජනතා උද්ඝෝෂණ දිගින් දිගට පැවැත්වෙමින් තිබේ.

මේ වන විට ජනතාවගේ අත්‍යවශ්‍ය ආහාර මිල ගණන් විශාල ලෙස ඉහළ නගිමින් ඇති අතර විදුලිය, ජලය, ප්‍රවාහන ආදී සේවාවන්හි මිල ගණන් දෙගුණ තෙගුණ වෙමින් ඇත. ඉහළ ගොස් තිබූ ඩීසල් හා පෙට්‍රල් ඉන්ධන මිල ගණන්වලට මෑතදීම එකතු වූයේ දිළිඳු ජනතාව සහ ධීවර ජනතාව වැඩි වශයෙන් පාවිච්චි කරනු ලබන භූමිතෙල් මිල සිව් ගුණයකින් ඉහළ දැමීමය. ආණ්ඩුව විවිධ සලාක ක්‍රම පාවිච්චි කරමින් ඉන්ධන පරිභෝජනය සීමා කර තිබියෙදී පවා බොහෝ ඉන්ධන පිරවුම්හල්වල ඉන්ධන නොමැති අතර ඉන්ධන තිබෙන ඒවායේ දිගු වාහන පෝලිම් ඇති වෙමින් තිබේ. මෙම ඉන්ධන හිඟය සහ මිල ඉහළ යාම පොහොර හිඟය නිසා අඩු වී ඇති වගාවේ මීළඟ අස්වනු නෙළීම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරවනු ඇති අතර පෙරළා නැවත වටයකින් ආහාර මිල ගණන් ඉහළ යවනු ඇතැයිද පැවසේ.

මේ වන විට ලංකාවේ ආහාර උද්ධමනය 91% දක්වා ඉහළ නැග ඇති අතර එක්සත් ජාතීන්ගේ ආහාර වැඩසටහනේ වාර්තාවකට අනුව ලංකාවේ මිලියන 6.3ක ජනගහනයක් ආහාර අනාරක්ෂිත තත්වයකට මුහුණ දී සිටියි. ආහාර මිල ගණන් වැඩි වීමේ වේගය ජූනි මාසයේදී සියයට 58.9 අගයක සිට ජූලි මාසයේදී 66.7ක් දක්වා ඉහළ නැග තිබුණේ ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වූ ඉහළම උද්ධමන අගය වාර්තා කරමිනි. මේ අතර හීනවෙමින් ඇති විදේශ සංචිත සිඳී යාම වළක්වා ගැනීම වෙනුවෙන් පසුගියදා මුදල් ඇමතිවරයා විසින් භාණ්ඩ 300කට වැඩි සංඛ්‍යාවක් ආනයනය තහනම් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කර තිබිණි. මේ ආනයන බොහොමයක්

>>02 වැනි පිටුවට

### 03 අර්බුදයට විසඳුම...



ආණ්ඩුවේ බොරු පම්පෝරි තිබියෙදීම රටේ විදේශ වත්කම් තව තවත් පහත වැටෙමින් තිබේ. ණය අර්බුදයට තවමත් විසඳුමක් නැත. දේශීයව මෙන්ම විදේශීයව වත්කම් උපයා ගැනීමට රනිල් - රාජපක්ෂ පාලනයට...

### 05 ජනතා සුනාමිය...



මේ පාර්ලිමේන්තුවට ජනතාවට සහන දෙන්න බැරි නම්, ජාතික සම්පත් විකිණීම නවත්වන්න බැරි නම්, මර්දනය නවත්වන්න බැරි නම් මේකෙන් ජනතාවගේ මතය නියෝජනය වෙන්නේ...

### 09 දේශපාලනය පංති ඇසකින්...



සටන් පෙරමුණු දෙකෙන් පළමුවැන්න වන්නේ ජනතා අයිතීන් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මෙන්ම මැතිවරණයක් දිනා ගැනීම වෙනුවෙන්ද පාර්ලිමේන්තුවට පිටින් මහ පාරේ සටන් වදින පංති බලවේග නායකත්වයන් දෙන සටන් පෙරමුණය..

තරුණ.................... 04
ජාත්‍යන්තර.................... 06
ආ.ර්ථිකය .................... 07
කාන්තා.................... 08
විශේෂාංග.................... 10
වේදිකාව.................... 11

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## ත්‍රස්ත පනතට එරෙහිව මහජන පෙත්සමකට අත්සන්



PTA ත්‍රස්ත පනත ඇතුළු මර්දන අණ පනත් අහෝසි කිරීමට හා ජාතික සම්පත් රැක ගැනීමට හා අයිතීන් වෙනුවෙන් සටන්කරන අත්අඩංගුවට පත් අරගලකරුවන් නිදහස් කිරීමට බලකරමින් වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය පසුගියදා මහජන පෙත්සමක් අත්සන් තැබීමට කටයුතු කළේය.

කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටට රැස්වූ වෘත්තීය සමිති නායකයින් සමග ජනතාව විශාල ලෙස මෙම පෙත්සම අත්සන් තැබීම සඳහා කටයුතු කළහ. මෙහිදී එම අවස්ථාවට සහභාගි වූ ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා සඳහන් කළේ මේ වන විටත් ලාභ ලැබිය හැකි සහ ලාබ ලබන තෙල් සංස්ථාව, ටෙලිකොම්, වරාය, විදුලි බල මණ්ඩලය රක්‍ෂණ සංස්ථාව ඇතුළු රාජ්‍ය ආයතන 40ක් පමණ විකිණීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටින බවත් එයට එරෙහිව පාරට බහින ජනතාව මර්දනය කිරීම සඳහා මෙවැනි අණ පනත් ගෙන එමින් තිබෙන බවත්ය. කෙසේ නමුත් රනිල් රාජපක්‍ෂලාගේ මර්දනයට එරෙහිව ජනතාව පෙළගස්වමින් මෙම ජාතික සම්පත් රැකගැනීම සඳහා සියලු වෘත්තීය සමිති එක්ව ක්‍රියාමාර්ග ගන්නා බවද ඔහු පැවසීය. මෙම අවස්ථාව සඳහා වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරු උදේනි දිසානායක, චන්දන සූරියආරච්චි, රොෂාන් පෙරේරා, නීතිඥ ජානක අධිකාරී ඇතුළු වෘත්තීය සමිති නායකයියෝ රැසක් එක්ව සිටියහ.

## සෞඛ්‍ය සේවකයින්ගෙන් විරෝධතා දිනයක්



ආණ්ඩුව විසින් සිදුකරන මර්දන ක්‍රියාමාර්ගවලට හා මේ වන විට සෞඛ්‍ය සේවාව මුහුණ දී ඇති දැවැන්ත අර්බුදයට විසඳුම් ඉල්ලා රට පුරා සෞඛ්‍ය සේවකයෝ පසුගිය අගෝස්තු 16 විරෝධතා දිනයක් ලෙස නම් කළහ. අත්‍යවශ්‍ය උපකරණ හා ඖෂධ ලබාදීමට, කොවිඩ් මර්දනයට පහසුකම් සැලසීම, කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් පරිදි ඉන්ධන හා ප්‍රවාහන පහසුකම් ලබාදීම ඇතුලු කරුණු ගණනාවක් මුල්කරගෙන මෙම විරෝධතාවය පැවැත්විණි. ඒ අනුව කොළඹ ජාතික රෝහල, මහනුවර, බදුල්ල, මාතර ඇතුළු රට පුරා ප්‍රධාන රෝහල්වල මෙම විරෝධතාවය පැවැත්වීමට කටයුතු යොදා තිබුණි. මෙම විරෝධතා ක්‍රියාමාර්ග ගනු ලැබ තිබුණේ සෞඛ්‍ය වෘත්තීය සමිති එකමුතුව මගිනි.

## පිරිපහදුව බේරා ගැනීමට තෙල් සමිති TUCC සමග ඒකාබද්ධ ගමනකට




ලාභ ලැබිය හැකි ආයතන විකුණා රට ආර්ථික අතින් තවත් දුර්වල කරන රනිල් - රාජපක්ෂ ආණ්ඩුවේ විකිණීමට එරෙහිව වෘත්තීය සමිති පෙළගැසීමේ පියවරක් ලෙස තෙල් සංස්ථාවේ වෘත්තීය සමිති හා TUCC - ඒකාබද්ධ ජනතා ව්‍යාපාරයේ වෘත්තීය සමිති ඒකාබද්ධව ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇත.

මෙහිදී තෙල් වෘත්තීය සමිති හා TUCC ය ඒකාබද්ධ මාධ්‍ය හමුවක් පවත්වා අවධාරණය කළේ තෙල් සංස්ථාව පාඩු ලබන්නේ දේශපාලඥයින් හා ජාවාරම්කරුවන් එක්ව සිදුකරන වංචා දූෂණ හේතුවෙන් බවය. අලෙවි කරන එක් තෙල් ලීටරයකින් සේවක පඩි නඩි සඳහා වැය වෙන්නේ ශත 92 වැනි ඉතා සුළු මුදලක් බවත් ඉතිරි සියලු මුදල් දේශපාලඥයින් හා ජාවාරම්කාරයින් එක්ව ගසාකන බව ඔවුහු පෙන්වා දුන්හ. මෙහිදී ලංකා ඛණිජ තෙල් පොදු සේවක සංගමයේ සභාපති අශෝක රංවල සහෝදරයා අදහස් දක්වමින් වත්මන් ඛනිජ තෙල් අමාත්‍යවරයා සේවකයින් නිසා තෙල් සංස්ථාව පාඩු ලබන බව පුන පුනා ජනතාවට පැවසුවද ඔහුගේ මැදිහත්වීම මත මීට පෙර තෙල් පිරවුම්හල් හිමියන් වෙත ලබාදුන් කොමිස් මුදල විශාල ලෙස වැඩි කර සංස්ථාවේ ලාභය ව්‍යාපාරිකයෙක් වෙත ගලාගෙන යාමට ඉඩ සලසා ඇති බව අවධාරණය කළේය.

ඒ අනුව පිරවුම්හල් හිමියන්ට 92 පෙට්‍රල් ලීටරයක් සඳහා පෙර ගෙවූ රු.4.86ක කොමිස් මුදල රු.13.50 දක්වාද, 95 සුපර් ලීටරයක් සඳහා ගෙවූ රු.5.10ක කොමිස් මුදල රු. 16.20 දක්වාද සුදු ඩීසල් සඳහා පෙර ගෙවූ රු. 3.63ක කොමිස් මුදල රු. 12.90 දක්වාද වන බවද සුපර් ඩීසල් ලීටරයක් සඳහා ගෙවූ රු. 4.35ක කොමිස් මුදල රු. 15.30 දක්වාද ඉහළ දමා සංස්ථාවට දිනකට අමතර කෝටි 08 ක මුදලක් පාඩු සිදු කර ඇති බව තෙල් සංස්ථා වෘත්තීය සමිති විසින් පෙන්වා දෙන ලදී. තෙල් සංස්ථාවට පාඩු කරන්නේ දේශපාලඥයින් හා ජාවාරම්කාරයින් බවට ඔවුහු අභියෝග කළහ.

මෙම අවස්ථාවට TUCC වෙනුවෙන් එහි සම කැඳවුම්කරු වන උදේනි දිසානායක, රවී කුමුදේශ්, චන්දන සූරියආරච්චි හා තෙල් සංස්ථා වෘත්තීය සමිති වෙනුවෙන් ආචාර්ය අශෝක රන්වල, නිශාන්ත රණවීර ඇතුළු වෘත්තීය සමිති නායකයෝ එක්වූහ.

## වෘත්තීය සමිති ව්‍යාපාරයෙන් පුරවැසි ආඥාවක්



රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ මර්දනය වහා නවතනු, මහජන දේපල විකිණීම නවතනු, ජනතාවට සහන දෙනු, ජනමතයට එරෙහි පාර්ලිමේන්තුව විසුරුවනු යන ප්‍රධාන කරුණු මුල්කරගෙන පසුගිය 09වැනිදා වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය රට පුරා ජාතික විරෝධතාවයක් පවත් වන ලද අතර කොළඹ පැවති විරෝධතා පා ගමන අවසානයේ නිදහස් චතුරස්‍රයේදී පුරවැසි ආඥාවක් නිකුත් කරන ලදී. මේ සඳහා භික්ෂූන් වහන්සේලා ඇතුළුව වෘත්තීය සමිති ව්‍යාපාර, දේශපාලන නියෝජිතයින්, කලාකරුවන් හා ගෝල්ෆේස් අරගලයේ නායකයෝද මෙහිදී පුරවැසි ආඥාවට අත්සන් තැබීමට කටයුතු කළහ.

## මර්දනය නවතනු! හදිසි නීතිය හකුළා ගනු! ජනමතයට එරෙහි පාර්ලිමේන්තුව විසුරුවනු! ලොව පුරා ශ්‍රී ලාංකිකයෝ උද්ඝෝෂණයේ

මර්දනය නවතනු! හදිසි නීතිය හකුළා ගනු, ජනමතයට එරෙහි පාර්ලිමේන්තුව විසුරුවනු යන සටන් පාඨ තේමා කර ගනිමින් ලොව පුරා නගර ගණනාවකදී ශ්‍රී ලාංකිකයෝ විරෝධතා උද්ඝෝෂණ පැවැත්වූහ. ස්විට්සර්ලන්තයේ ජිනීවා, බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත්, ප්‍රංශයේ පැරිස්, බ්‍රිතාන්‍යයේ ලන්ඩන්, දකුණු කොරියාවේ සෝල් නුවර පාර්ලිමේන්තුව ඉදිරිපිට, එක්සත් ජනපදයේ නිව්යෝර්ක් ඇතුළු ස්ථාන ගණනාවකදී මෙම උද්ඝෝෂණ පැවැත්විණි. මෙහි ඇතුළත් වන්නේ එම උද්ඝෝෂණ අවස්ථාවන්හි ඡායාරූප සටහනකි.



පැරිසිය...



සෝල්...



පර්ත්...





ලන්ඩන්...



නිව්යෝර්ක්...



නගෝයා...



ජිනීවා...

## ජනපීඩක ආණ්ඩුව...

01 පිටුවෙන්

මෙරට නිෂ්පාදන හා ස්වයං රැකියා සඳහා අදාළ වන භාණ්ඩ හා උපකරණ වන බැවින් බොහෝ පිරිසගේ ජීවනෝපායන්ට දැඩි බලපෑම් එල්ල වීමට බලපානු ඇත.

කෙසේ වුවද ජනතාව පත්වෙමින් තිබෙන අර්බුදකාරී තත්වය පිළිබඳව රනිල් - රාජපක්ෂ ආණ්ඩුව අසංවේදීව සිටින අතර අර්බුදය විසඳාලීමට අදාළව කිසිදු මැදිහත්වීමක් නොමැති තරම්ය. ඔවුන් විසින් සම්පූර්ණ විශ්වාසය තබා ඇත්තේ මූල්‍ය අරමුදලේ ණය ලබා ගැනීම මත වන අතර ඒ වෙනුවෙන් වන කොන්දේසි ඉටු කිරීමේදී බලශක්තිය, ප්‍රවාහනය වැනි තීරණාත්මක ක්ෂේත්‍රයන්හි රාජ්‍ය අයිතිය අහිමි වීමටත් විශාල පිරිසකට තමන්ගේ රැකියා අහිමි වීමටත් හේතු වනු ඇත්තේ අර්බුදය තවත් වටයකින් උග්‍ර කරමිනි.

මේ සියලු තත්වයන් තුළ පීඩාවට පත්වන ජනතාව අරගල මගට පැමිණීම වැළැක්වීම වෙනුවෙන් ආණ්ඩුව, ආරක්ෂක අංශවල සහ මර්දන නීතිවල පිහිට පතා ඇති අතර මානව හිමිකම් උල්ලංඝනය කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය නැවතත් ක්‍රියාවේ යොදමින් සිටී. මෙම තත්වය දිගු කාලයක් පවත්වා ගැනීමට ඉඩ නොදිය යුතුව ඇති බැවින් නව ජනවරමකට අවස්ථාව ලබා දෙන ලෙස බලකරමින් ජාතික ජන බලවේගයේ නායකත්වයෙන් ජනතා බලවේග වේගයෙන් පෙළගැසෙමින් සිටියි. පසුගිය 20වැනිදා නුගේගොඩදී ජාතික ජන බලවේගය සංවිධානය කරන ලද දැවැන්ත විරෝධතා පාගමනකින් සහ ජන රැලියකින් මෙම විරෝධතා උද්ඝෝෂණ ආරම්භ වූ අතර යුරෝපයේ ශ්‍රී ලාංකික සංවිධාන පසුගිය 28වැනිදා ජිනීවාහි මානව හිමිකම් කවුන්සලය ඉදිරිපිට දැවැන්ත විරෝධතාවක් පවත්වන ලදී. ඊට සමගාමීව පර්ත්, පැරීසිය, නගෝයා, ලන්ඩනය සහ සෝල් වැනි නගරවලදීද ශ්‍රී ලාංකිකයින්ගේ විරෝධතා සංවිධානය වී තිබිණි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ‘ත්‍රස්තවාදී’ පනත අහෝසි කරනු!

පසුගිය මාස කීපයක් තිස්සේ පැවති පොදුජන විරෝධයට, ආණ්ඩු විරෝධී අරගලයට, සම්බන්ධ වූ ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගනිමින් බොරු චෝදනා මත අධිකරණයට ඉදිරිපත් කොට රක්ෂිත බන්ධනාගාරගත කරමින් මර්දනකාරීත්වයක් නිර්මාණය කළ රනිල් - රාජපක්ෂ පාලනය ඉන් නතර නොවී අරගලයට සම්බන්ධ ක්‍රියාකාරීන් මර්දනයට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතද යොදාගෙන තිබේ. ඒ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අන්තරේ කැඳවුම්කරු ඇතුළු තිදෙනෙක් දින 90 කාලයක් සඳහා රඳවා ගැනීමට රැඳවුම් නියෝග නිකුත් කරමිනි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ විශේෂ විධිවිධාන පනත ජේ.ආර්. ජයවර්ධන පාලනය විසින් සම්මත කර ගනු ලැබුයේ 1979දීය. ඒ මොහොතේදී මෙම පනතේ භයානකකම හා අනතුර දුටු ජ.වි.පෙ. 1979දී එය පැරදවීම සඳහා වමේ පක්ෂ 4ක් හා එක්ව විරෝධතා රැලි මාලාවක්ද සංවිධානය කළේය. ඒ, මෙම පනත පිළිබඳ ජන මතයක් ගොඩනගා එය පැරදවීමටය. එහෙත් ජයවර්ධන පාලනය එය අහෝසි කළේ නැත. ඒ වෙනුවට 1987 - 90 කාලය පුරාම ජ.වි.පෙ. මර්දනය කිරීමටත් විරුද්ධ මතධාරීන් මර්දනය කිරීමටත් එය යොදා ගන්නා ලදී.

ප්‍රජාතන්ත්‍රවාදයට, මානව හිමිකම්වලට හා මූලික මිනිස් අයිතිවාසිකම්වලට අනුව මෙම පනත ශිෂ්ට සමාජයට නොගැලපෙන ම්ලේච්ඡ පනතකි. සැබැවින්ම මෙම පනත මගින් සිදුවන්නේ ත්‍රස්තවාදය වැළැක්වීම නොව, ආණ්ඩු විරෝධීන්ට එරෙහිව, විරුද්ධ මතධාරීන්ට එරෙහිව රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාත්මක කිරීමට නෛතික ආවරණයක් සකසා ගැනීමකි.

මෙම පනතට අනුව ආරක්ෂක අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි ආරක්ෂක ලේකම්වරයාගේ අත්සනින් ඕනෑම පුද්ගලයෙක් අධිකරණයටද ඉදිරිපත් නොකර දින 90ක් එකදිගට රඳවා තැබීමට පුළුවන. අදාළ පුද්ගලයන් රඳවා තබන්නේ කොතනකද යන්න තීරණය කිරීමේ බලයද ආරක්ෂක ලේකම්වරයාට තිබේ. එසේම එලෙස රඳවාගෙන බියවද්දා ලබාගන්නා කටඋත්තරයක් අදාළ පුද්ගලයාට එරෙහිව සාක්ෂියක් ලෙස යොදාගැනීමේ නීතිමය ඉඩද මෙම පනතින් පොලීසිය වෙත ලබාදී තිබේ. මෙම පනත මූලික මානව හිමිකම්වලට පටහැණි ම්ලේච්ඡ පනතක් වන්නේ මේ නිසාය. එබැවින් ශිෂ්ට සමාජයකදී කළ යුත්තේ මෙම පනත වහාම අහෝසි කිරීමය.

මෙම පනත ක්‍රියාවට නැගීමේ ඊළඟ බරපතළ කරුණ වන්නේ ‘ත්‍රස්තවාදය’ යනු කුමක්දැයි නිර්වචනය කිරීමය. පනතේ නම ‘ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත’ වුවාට ත්‍රස්තවාදය කුමක්දැයි තීරණය කරන්නේ ඒ මොහොතේ බලයේ සිටිනා පාලකයින්ය. කිසියම් ක්‍රියාවක් ත්‍රස්තවාදීද, යම් පුද්ගලයෙක් කර තිබෙන්නේ ත්‍රස්තවාදී ක්‍රියාවක්ද යන්න නිර්ණය කරන්නේ පාලක කණ්ඩායම විසිනි. ජනාධිපති හෝ ආරක්ෂක ඇමති විසිනි. එවිට “කබරගොයා තලගොයා කිරීමට” ඔවුනට පුළුවන.

තාජුඩීන් ඝාතනය, ලසන්ත ඝාතනය, මාධ්‍යවේදීන් හා ළමුන් අතුරුදහන් කිරීම, මහ බැංකු බැඳුම්කර වංචාව, මිග් යානා ගනුදෙනු වංචාව, පාර්ලිමේන්තුවේ සභාගර්භයේ දේපළ කඩාබිඳ දැමීම ත්‍රස්තවාදී ක්‍රියා නොවී ආණ්ඩුවට එරෙහිව මහමඟ උද්ඝෝෂණය කිරීම ‘ත්‍රස්ත’ ක්‍රියාවක් වන්නේ මේ අනුවය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රජාතන්ත්‍රවාදයට හා මූලික මිනිස් අයිතීන්ට පටහැණි වූවක් නිසා එය අහෝසි කරන ලෙස පසුගිය කාලය පුරාම ජාත්‍යන්තර හා දේශීය මානව හිමිකම් සංවිධානවලින් ආණ්ඩුවලට නිතර බලපෑම් එල්ල විය. 2015 බලයට ආ රනිල් - මෛත්‍රී පාලනය මෙම පනත අහෝසි කොට වෙනත් පනතක් ගෙනෙන බවද පැවසීය. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා වර්තමානයේද එයම පවසයි. එහෙත් ඒ අතරම අහෝසි කළ යුතු යැයි කියන මෙම පනත සාමකාමී උද්ඝෝෂණවල යෙදුන අයට එරෙහිව යොදාගනී. ජනාධිපතිවරයාගේ දුෂ්ට වුවමනාව පෙනී යන්නේ එයිනි.

ධනවාදය පවත්වාගෙන යාමට නොහැකි තරමින් අර්බුදයට ගිය විට, ජනතා විරෝධයන් උත්සන්න වූ විට, තම බලය අහිමි විය හැකි බව දැනුන විට බියට පත්වන පාලකයින්ගේ එකම විසඳුම වූයේ ජනතාව බියවැද්දීමය. එබැවින් ඉතාම සාමකාමී උද්ඝෝෂණවල යෙදුන ක්‍රියාකාරීන් මර්දනයට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීමෙන් පෙන්වන්නේ ආණ්ඩුවේ ශක්තිය නොව දුර්වලතාවයය; ජනාධිපතිවරයාගේ නිර්භීතභාවය නොව බියගුලු බවය.

මෙම මර්දන නීති පැරදවිය යුතුය. එහෙත් දුෂ්ට හා ජනපීඩක පාලනයක් පවතිද්දී එහි නීති පමණක් පැරදවීමෙන් ප්‍රතිඵල ලැබෙන්නේ නැත. ඒ නිසා මෙම දුෂ්ට හා ජන පීඩක, මර්දනකාරී පාලනයම පැරදවීමට ජනතාව පෙරමුණ ගත යුතුය; අදිටන් කර ගත යුතුය. බිඳ වැටුන, ජනතාව ප්‍රතික්ෂේප කරන පාලනයක් මර්දන නීතිවලින් රැක ගත නොහැක. අවසාන වශයෙන්, මෙවැනි උත්සාහයන් පිළිබඳව ලෙනින් වරක් පැවසූ වදනකින් මෙය නිමාකරමු.

“බයිනෙත්තු බොහෝ දේ සඳහා ප්‍රයෝජනවත් වන නමුත් ඒ මත ඉඳගැනීම සඳහා නොවේ”

# අර්බුදයට විසඳුම විරෝධයට බැට දීමද?



“ධනපති ක්‍රමයේ අර්බුදයෙන් මිදීමට ධනපති පංතිය දරන උත්සාහය වූ කලී අයෙක් තමන්ගේම සපත්තු පටිවලින් ඇද තමාවම ඔසවා ගැනීමට දරන උත්සාහයක් වැනිය” යැයි වරක් ලෙනින් පවසා තිබේ. එය පරම සත්‍යයකි. එලෙසින්ම ධනවාදය තුළ රටක් වැනසූ පාලක කල්ලිවලටම ඒ රට ගොඩග ැනීමට හැකි යැයි සිතන්නේ නම් එයද මුලාවකි. ලංකාවේ දැන් අප දකිමින් සිටින්නේ එයයි.

දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රමිකව වර්ධනය වී ආ අපේ රටේ අර්බුදය පුපුරා ගොස් රට ආර්ථික අගාධයකට වැටී දැන් වසරකටත් වැඩිය. එම අර්බුදය ජනතාවට කොතරම් තදින් බලපෑවේද යත් පොදු ජනයා ලක්ෂ ගණනින් පාරට බැස හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ රටින් පලා යන තුරු උද්ඝෝෂණ කළේය. අවසානයේ ඔහු ජනාධිපතිකමෙන් ඉල්ලා අස්විය. එහෙත් ඉන් ආර්ථික, සමාජ අර්බුදයට කිසිදු විසඳුමක් ලැබුණේ නැත. ඒ ගෝඨාභය ඉවත් වුවද තමන් කැමති පාලනයක් පත්කර ගැනීමට ජනතාවට අවස්ථාව නොලැබුණ නිසාය. ගෝඨාභය ඉවත් වීමෙන් ඇති වූ පුරප්පාඩුවට රාජපක්ෂවරුන් රනිල් පත්කරන ලදී. දැන් සිදුව තිබෙන්නේ කුමක්ද?

පිනට ලැබුණ ජනාධිපතිකමක් බාරගත් රනිල්ට වර්තමානයේ රට මුහුණ දී සිටින දැවැන්ත අර්බුදය පිළිබඳ නිවැරදි වැටහීමක් හෝ අර්බුදය විසඳීම සඳහා අවම ක්‍රියාමාර්ග තිබෙන බවක් හෝ පෙනෙන්නට නැත. රනිල් සිදුකරමින් සිටින්නේ අර්බුදය විසඳීම පසෙක තබා අර්බුදය විසින් නිර්මාණය වූ ජනතා විරෝධයට පන්න පන්නා බැට දීමය.

ලංකාවේ අත්‍යවශ්‍ය ආහාර ඇතුළු බඩු මිල දිනපතා වේගයෙන් ඉහළ යමින් තිබේ. ආණ්ඩුව භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ දමමින් සිටියි. පසුගියදා විදුලි ගාස්තු 75%කින් ඉහළ දැමූ රනිල් - රාජපක්ෂ ආණ්ඩුව ඉන්පසු රු:87/-ට තිබූ භූමිතෙල් ලීටරය රු:340/- දක්වා එනම් එකවර රු:257/-කින් වැඩි කළේය. එය ඉතාම පහළ ආදායම් ලබන අයට, සුළු පරිමාණ ධීවරයාට මාරාන්තික ලෙස බලපා තිබේ. රට තුළ බිත්තරයක් රු:65/- සිට 70/- සීමාවට ගියේ ආණ්ඩුවේ මිල පාලන ගැසට් නොසලකමිනි.

දැන් ලංකාවේ ආහාර උද්ධමනය 91%කි. ලොව වැඩිම ආහාර උද්ධමනය ඇති රටවල් අතර ලංකාව 4වැනියා බව සඳහන් වේ. රජයේ වියදමට මුදල් නැති ආණ්ඩුව ඒ සඳහා කළේ මුදල් අච්චු ගැසීමය. එය ආර්ථිකයට අහිතකර වන නිසා එසේ නොකරන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මහ බැංකුවට අනතුරු අඟවා තිබියෙදී පසුගිය දිනවල තවත් රුපියල් මිලියන 1700ක් මුද්‍රණය කිරීමට ආණ්ඩුව තීරණය කළේය. එම මුදලත් වෙළඳපොළට ආ විට රටේ උද්ධමනය 100% වනු ඇත. එවිට සිදු වන්නේ ජනතාවට නිරාහාරව සිටීමටය.

ආණ්ඩුවේ බොරු පම්පෝරි තිබියෙදීම රටේ විදේශ වත්කම් තව තවත් පහත වැටෙමින් තිබේ. ණය අර්බුදයට තවමත් විසඳුමක් නැත. දේශීයව මෙන්ම විදේශීයව වත්කම් උපයා ගැනීමට රනිල් - රාජපක්ෂ පාලනයට කිසිදු වැඩපිළිවෙළක් නැත. ඔවුනට ඇති එකම විසඳුම ආනයන සීමා පැනවීමත්, මිල වැඩි කිරීමත්, බදු වැඩි කිරීමත් පමණි. එය අර්බුදයට විසඳුමක් නොවන අතර අර්බුදය තව තවත් වර්ධනය කරන්නක් වේ. පසුගිය දිනවල විදුලි උපකරණ, සමහර ආහාර වර්ග, ස්වයං රැකියාවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය, යටඇඳුම් ඇතුළු භාණ්ඩ 300ක් සඳහා ආනයන තහනමක් පැනවීම ඊට එක් උදාහරණයකි. මේ තීරණය සමග සමහර භාණ්ඩ (සම්භාණ්ඩ, විදුලි උපකරණ, ඉලෙක්ට්‍රොනික උපාංග) අලෙවි කරන වෙළඳසැල් වසාදැමීමට සිදුවන අතර රූපලාවන්‍ය වැනි ස්වයං රැකියා කළ විශාල පිරිසකට එම සේවා පවත්වාගෙන යැමට නොහැකිව ඒවා වසා දැමීමට සිදුවනු ඇත. ඉන් පෙන්වන්නේ අර්බුද විසඳෙනවා නොව ඔඩු දුවන බවය.

පවත්නා අර්බුදයෙන් මිදීම සඳහා රනිල් - රාජපක්ෂ පාලනය බලාපොරොත්තු තබා ඇති එකම විසඳුම වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් උදව් ගැනීමය. එය කිසිසේත්ම රටේ අර්බුදයට විසඳුමක් වන්නේ නැත. ලංකාවේ විනයක් නැති මූල්‍ය පාලනය හා චාරයක් නැති ණය ගැනීම් හා කොමිස් ගැසීම් ගැන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දක්වන්නේ නොසතුටකි. ඒ නිසාම මූල්‍ය අරමුදලේ පිහිට පැතීම අර්බුදය විසඳීමට මඟක් වන්නේ නැත. ඒ වෙනුවට මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටුකිරීම වෙනුවෙන් ජනතාව මත තව තවත් බර පැටවීමට ආණ්ඩුවට සිදුවනු ඇත. ආණ්ඩුව දැනටමත් එවැනි පියවර ගනිමින් තිබේ.

2020 මාර්තු 02 ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිකුත් කළ පත්‍රිකා අංක 4 නම් නිවේදනයේ සඳහන් පරිදි ඔවුන් ලංකාවට ප්‍රධාන ක්‍රියාමාර්ග 4ක් යෝජනා කර තිබේ. ඒ, රාජ්‍ය ආදායම වැඩිකර ගැනීම සඳහා VAT හා ආදායම් බදු වැඩිකිරීම, රුපියල පාවෙන තත්වයක පවත්වාගෙන යාම, බලශක්ති ක්ෂේත්‍රයේ වියදම් පියවා ගත හැකි (Cost - recovery) ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හා පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමය. රට තුළ විදුලි බිල වැඩිවන්නේ, භූමිතෙල් මිල වැඩි වන්නේ මේ අනුවය. දැන් ජල බිලද වැඩි කර ඇත. එසේම රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ නාමයෙන් තැපැල් සේවාව, දුම්රිය, තෙල් සංස්ථාව ඇතුළු රාජ්‍ය ආයතන 39ක් විකිණීමට හෝ රාජ්‍ය වගකීම අතහැරීමට සූදානම් කර තිබේ.

රටේ තෙල් ප්‍රශ්නයද තවම විසඳී නැත. ඉන්ධන මිල තිබෙන්නේ ජනතාවට දරාගත නොහැකි මට්ටමකය. ඉන්ධන පරිභෝජනය සැලකිය යුතු ලෙස අඩු වීමට එය හේතුවක් වී තිබේ. එහි වාසිය ආණ්ඩුව ලබාගෙන ඇත. එහෙත් ප්‍රශ්නය බරපතළය. ඉදිරියේ රට තුළ ගොයම් කැපීම ආරම්භ වන විට තත්වය බරපතළ වේ. මීට වසරකට පමණ පෙර අක්කරයක ගොයම් කැපීමට රු:7000ක් පමණ වැය වුවද දැන් අක්කරයක ගොයම් කැපීමට රු:25,000ක් රු:30,000ක් අතර මුදලක් වැය වන බව පැවසේ. එසේ වූ විට වී මිල ඉහළ යන අතර එහි ප්‍රතිඵලය වන්නේ සහල් මිල යළිත් වැඩිවීමය. මේ සියල්ලෙන් පෙන්වන්නේ අර්බුදය වර්ධනය වෙමින් පවතිනවා මිස විසඳෙන මඟකට අවතීර්ණ වී නැති බවය.

සැබෑ ලෙසම මේ අර්බුදය විසඳීමට වර්තමාන පාලනයට හෝ මේ විනාශයට වගකිවයුතු කිසිම ධනවාදී දේශපාලන පක්ෂයකට නොහැක. දැන් රනිල් වික්‍රමසිංහ ජනාධිපති බලය යොදාගෙන කරමින් සිටින්නේ අර්බුදය විසඳෙන ක්‍රියාමාර්ග ගැනීම නොව අර්බුදය තව තවත් ගැඹුරු කිරීමය. අර්බුදයෙන් පෙළෙන ජනයා මර්දනයෙන්ද පෙළීමය. රනිල් - රාජපක්ෂ පාලනයේ අරමුණ ඉතා පැහැදිලිය. රනිල් ඉතිරි අවුරුදු 2කට මදක් වැඩි කාලයම ජනාධිපති ධුරය දැරීමට සූදානම්ය. (සමහර විට රනිල් ජනාධිපති ධුරයේ කාලය අවසන් වීමට වසරකට පෙර හදිසි ජනාධිපතිවරණයක් කැඳවීමටද ඉඩ තිබේ) ඒ අතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සතුටු කිරීමට පාර්ලිමේන්තුව ඉදිරි අවුරුදු 03ම පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා ජනතාව බියවද්දා තබාගත යුතුය. පසුගිය කාලයේ සිදුවූ ජනතා නැගිටීමට සම්බන්ධ තෝරාගත් අය අත්අඩංගුවට ගනිමින් ඔහු කරන්නේ එයයි. අර්බුදයට විසඳුම් සෙවීමට නොහැකි බව දන්නා පාලකයෝ නැවත පැන නැගිය හැකි ජනතා විරෝධයන් වැළැක්වීමට දැන් විරෝධතාකරුවන් දඩයම් කරමින් බියවද්දමින් සිටිති. මෙය ඉතාම අසාර්ථක උත්සාහයක් බව කිව යුතුය. සුළං පිරවූ රබර් බෝලයක් දියයට ඔබාගෙන වැඩි වේලාවක් සිටීමට නොහැකි ලෙසට ජනතාවගේ විරෝධයන්ද මර්දනය මගින් යටපත් කළ නොහැක. ජනතා විරෝධයට උපත දෙන සමාජ ආර්ථික අර්බුදය එලෙසම තිබියෙදී, එය තව තවත් වර්ධනය වෙද්දී විරෝධය පමණක් නතර කළ නොහැක. එබැවින් මෙය විසඳෙනු ඇත්තේ රනිල් ප්‍රමුඛ ආණ්ඩුවම එළවා දමා, නව වරමක් සඳහා ජනතාවට අවස්ථාවක් ලබා ගැනීමෙන් හා ජනතාවාදී පාලනයක් පිහිටුවීමෙන් පමණි. එතෙක් රනිල්ලා, රාජපක්ෂලා රත්වන සැලියේ කකුළුවන් මෙන් දිය කෙළිනු ඇත.

> ‘ආණ්ඩුවේ බොරු පම්පෝරි තිබියෙදීම රටේ විදේශ වත්කම් තව තවත් පහත වැටෙමින් තිබේ. ණය අර්බුදයට තවමත් විසඳුමක් නැත. දේශීයව මෙන්ම විදේශීයව වත්කම් උපයා ගැනීමට රනිල් - රාජපක්ෂ පාලනයට කිසිදු වැඩපිළිවෙළක් නැත.’








## මර්දනයඃ පාලන කොමාවේ අවසන් තිත

තාමත් රාජපක්ෂලාගේ බැල්ම පෙරේත ගොටුවේය. රනිල් රාජපක්ෂලා තම සුබ විහරණය, ආරක්ෂාවත් වෙනුවෙන් නොකරන දෙයක් නැත. ජූලි 09 කොළඹට ආ "අරගලය" විසින් අන්දුන් කුන්දුන් වූ රාජපක්ෂලා තමන්ට යන එන මං නැති වන බව කිසිසේත්ම නොසිතන්නට ඇත. තමන්ට පුරවැසිභාවය ඇති රටවල් හෝ තමන්ගේ දොළ පිදේනි ගත් එක් එක් රාජ්‍යයන්වල මිත්‍ර පාලකයින්වත් තමන්ට පිහිටවීමට ඉදිරිපත් වූයේ නැත. එය නිකම්ම නිකම් සිදුවීමක්ම නොවේ. මෙරට තරුණ ප්‍රජාව මෙන්ම පොදු මහජනයාගේ "ජනතා බලයයි." "ඔය කොයි කවුරුත්" ජනතා බලයට යටත්ය.

ජූලි 09 අරගලයෙන් බියපත් වූ පාලකයෝ තමන්ට හිමි නැති " ජනතා බලය", තමන්ට හිමි "ව්‍යවස්ථාමය" බලයෙන් යට කරගන්නට විවිධ පන්නයේ ක්‍රියාමාර්ග ගනිමින් සිටිති. මානව හිමිකම් සංවිධාන ඇතුළු ලෝකයේ විවිධ සංවිධාන මර්දනයට එරෙහිව විරෝධය පළකරද්දී රනිල් රාජපක්ෂලා තමන්ගේ මුග්ධ බලය බයිනෙත්තුවෙන් ජනයා අභිමුවට එල්ල කරමින් සිටී. ඒ තමන්ගේ බලය පෙන්වීමටත් වඩා තම "බිය" පහකර ගැනීම සඳහාය. එනම් කුලප්පු වූ වල් අලියෙකුට ඉරටුවක් දිගුකරන්නෙකු වැනි ළදරු මානසිකත්වයකි. රනිල් රාජපක්ෂලා අබැටක් තරම් බලයක් තබාගෙන ගහන්න යන "ගේම" , එදා හයෙන් පහක බලයක් තබා ගෙනත් ගහන්නට බැරිවූ "ගේම" හා සමපාත වන්නේ කෙසේදැයි අප බලා සිටින්නෙමු. ඒ කතා කෙසේ වෙතත් මෙම "අරගලය" ඉතිහාසයේ ලියවිය යුතු තැන්වල ලියවිය යුතු ආකාරයට ලියැවී තිබීම ඔවුන්ගේ මුග්ධ මර්දනයට අවලංගු කළ නොහැකිය. මන්ද, එය ජනතා පරමාධිපත්‍ය බලයෙන් ලියූ ඓතිහාසික සටහනකි.

"ආසියාවේ ලොකුම මොළය" දැන් විධායක බලයේ සිටින බව එදා රනිල්ට පන්න පන්නා පහර දුන් පොහොට්ටුවේ ලොක්කන්ගේ මුවින්ම පිටවීම අතිශය දෛවෝපගත සරදමකි. නැවත රට විකිණීමටත්, යළි පුබුදමු ශ්‍රී ලංකා වැනි ව්‍යාපෘතිවලින් තවත් රට විනාශ මුඛය වෙත ගෙන යාමත් කරන්නේ නම්, එවැනි "මොළ" හොඳ කොහේ ඔබන්නටදැයි අප ඔවුන්ගෙන් අසමු.

අරගලය බලාපොරොත්තු වූයේ මෙවැන්නක් නොවේ. හොර දෙටුවන් සහ හිච්චි හොරුන්ගේ සැබෑම ආරක්ෂකයා ලෙස රනිල් "හොර ජන වරමින්" පුටුවේ හිඳුවා ගනු ලැබුවේ "ජනවරමකින්" කළ යුතු ප්‍රතිසංස්කරණ හා සංශෝධන සිදු කිරීමට නොවන බව ඔවුන්ට මතක් කළ යුතුය. රනිල්ගේ හිතලු ක්‍රියාත්මක කිරීමට නම් රනිල් පළමුවෙන්ම කළ යුත්තේ හෘදසාක්ෂියේ ලැජ්ජාවට ඉඩ දී නව ජනවරමකින් බලයට පත්වී එම කටයුතු ඉදිරියට සාක්ෂාත් කිරීමය. තමන්ට නැති ජනවරමක් රැකීමට පොලීසිය, හමුදාව යොදවා කොල්ලන්ගෙ ඔළු පැලීමත්, කෙල්ලන්ගෙ යට ඇදුම් ඉරා දැමීමත්, කෙස් වල්ලෙන් බිම ඇදගෙන යාමත් නොවන බව මතකයේ තබා ගැනීම වැදගත්ය.

මාධ්‍ය ඉදිරියේ අප දකින "රනිල්" සහ ඇත්ත "ජනපති රනිල්" යනු දෙදෙනකු බව අප දන්නෙමු. රනිල්ගේ මර්දනකාරී මනසත් පජාත දේශපාලන ගමන් මඟත් අපි ඉතා හොඳින් දනිමු. ඉතිහාසයේ කෙදිනක හෝ නොලැබුණ, විධායක බලය කෙසේ හෝ මහලු අවධියේදී වත් අත්පත් කරගැනීමට ඔහුට තිබූ ආශාවත් ඉතා හොඳින් දනිමු. නැවත පොහොට්ටුවත්, සජබයත්, යූඑන්පීයත්, ශ්‍රීලනිපයත් එකට එක්ව තමන්ගේ මජර කැත වසා ගැනීමට පොරවා ගත් පොරවාගත් "සර්ව පාක්ෂික" සළුවද අපට ඉතා හොඳින් වටහාගත හැකිය. එවැනි අටමගලයකින් හෝ අද දින ජනතාව පත්ව සිටින අතිශය දුක්ඛිත පීඩිතභාවයෙන් මුදවා ගැනීමේ සාකච්ඡාවක්, සැලසුමක් පෙනෙන්නට හෝ තිබේද? ඔවුන් විසින් මාරුවෙන් මාරුවට බලයට පත්ව ඇති කරන ලද අර්බුදය, අද ඔවුන්ගේම බලය වෙනුවෙන් "සන්නාමයක්" බවට පත් කොටගෙන රාජ්‍ය ආයතන, සමාගම්, කර්මාන්ත පුද්ගලීකරණය කිරීමත්, සම්පත් හා ණයවලින් ගොඩනගන ලද වත්කම්, දේපළ විකිණීමත් හැර මෙම අර්බුදය පියමන් කිරීමට ඔවුන්ට ඇති "නව මාවත" කුමක්ද?

අරගලයේ ප්‍රධාන සටන් පාඨවලට කිසිදු අස්වැසිල්ලක් ලැබී නැතුවා සේම, තව තවත් රට කාබාසිනියා කරන කම්බා හොරු රැළ, අරගලය දඩයම් කිරීම තමන්ගේ අවසන "පරිච්ඡේදය" කිරීමට මාන බලති. එහෙත් අපි ඔවුන්ගේ "කන් අඩි පුපුරන" ශබ්දයෙන් හඳුනගා කිව යුතු කතාවක් තිබේ.

කෝටි ගණනක් ජනයාගේ අයිතියත්, හෙට දවස වෙනුවෙන් දිවි හිමියෙන් සටන් කිරීම තරම් භාග්‍යයත් අපට මතු කෙදිනකවත් ලැබෙන්නේ නැත. අපගේ පරම්පරාව එය මේ මාතෘභූමියේ යථාර්ථයක් බවට පත් කරන බව පාලකයින් වන නුඹලා සිහි තබා ගත යුතුමය. නුඹලාගේ මර්දනයෙන්, මේ මාතෘ භූමියට ලැදි මහජනයා තව තවත් අවදි වනවා සේම, ඉමහත් ධෛර්යයෙන්, හෙට මේ අරගලය, නුඹලා රකින මුළුමහත් 'ක්‍රමයම' පෙරළා දමා වඩාත් සාධාරණය, යුක්තිය රජයන, දියුණු රාජ්‍යයක්, මානව දයාවෙන් පිරිපුන් සුන්දර සමාජයක් බිහිකිරීම නුඹලාට කෙලෙසකවත් නවතාලිය නොහැකි බවද සිහිතබා ගත යුතුය.

## ඇවිලෙනු මැන නිදහස




'ඇවිලෙනු මැන නිදහස' යන මැයෙන් පසුගිය ආගෝස්තු 27 වන දින අරගලකරුවන් විසින් සංවිධානය කරන ලද විරෝධතාවයක් නිදහස් චතුරස්‍රය ඉදිරිපිටදී පැවැත්විණි. මෙම විරෝධතාව කුරුඳුවත්ත මංසන්ධියෙන් ආරම්භ කර නිදහස් චතුරස්‍රය දක්වා පාගමනින් පැමිණි අතර එහිදී පන්දම් පත්තු කරමින් විරෝධතාවය දියත් විය. වත්මන් ආණ්ඩුව විසින් ගෙන යන මර්දනය වහාම නතර කරන ලෙසත් ජනතාවගේ නිදහසට අතනොතබන ලෙසත් බල කරමින් මෙම විරෝධතාවය පැවැත්විණි.

## අරගලයේ ඉදිරි ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා



අරගලයේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා මාලාවක් සමජාවාදී තරුණ සංගමය මගින් රට පුරා පැවැත්වීමට සූදානම් කර තිබේ. එම වැඩසටහන කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල මේ වන විට ආරම්භ කර ඇති අතර ආගෝස්තු 22 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ආසනයේ සමනබැද්ද ප්‍රදේශයේ සහ කොළඹ, අවිස්සාවේල්ල, හෝමාගම, කඩුවෙල ප්‍රදේශවලද තරුණ තරුණියෝ එක්ව අරගලයේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කළහ. මේ අවස්ථාවන්ට තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයාද සහභාගි විය.

## අරගලකරුවන් දඩයම් කිරීම ගැන තානාපති කාර්යාල දැනුවත් කෙරේ



වත්මන් ආණ්ඩුව විසින් අරගලකරුවන් දඩයම් කිරීම ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කරන්නාවූ ත්‍රස්ත පනත සහ ඉදිරියේදී සම්මත කර ගැනීමට සැරසෙන මර්දන පනත් පිළිබඳවත් අරගලකරුවන් අනීතිකව අත්අඩංගුවට ගැනීම පිළිබදවත් අරගලකරුවෝ අගෝස්තු 24වැනි දින තානාපති කාර්යාල වෙත පැමිණිලි කළහ. මේ අවස්ථාවේදී ඉන්දියාව, ජපානය, රුසියාව ඇමරිකාව හා එක්සත් රාජධානිය යන රටවල තානාපති කාර්යාල වෙත මෙම පැමිණිලි ඉදිරිපත් කෙරිණි.

## කියවීම සම්පූර්ණද?

වසරක් ගෙවී සාහිත්‍යයට
කියවීම ඇත්තෙ මාසෙකට
ලියපු කතා කවි ලෝකෙකට
සම්පූර්ණද කිසිවක් හැබෑවට...

පරාර්ථය ආත්මාර්ථය
වෙන්කරනු නොහැකිව
ලියැවෙයිද සාහිතක
පොතක පත්තරයක...

හිඟමනට වැටුණ දේශයක
කොන්ද බිඳ දැමූ රාජ්‍යයක
ඉදින් සම්පූර්ණද මිනිස්සු
කොහොම කියවීමද ලිවීමද...

ආදි කල තිබු හැටි
මුතුන්මිත්තන් කළ හැටි
කිය කියා ගජරාමෙට
තප්පුලයි හිඟාකාගෙන..

වික්කෙ නෑ රජ කල වැව්
නැසුවෙ නෑ එකල සම්පත්
ලියා තිවු දේ අගයත්
රැක්කෙ රටත් වැසියත්..

බහුබූත දොඩා ලෝකෙට
ණය බරෙන් ඔක්කෝම
ගිලෙනකොට
කියවීම ලීවීම විතරක්ම
නොවෙයි රට රකින අසිපත...






### Kingii - ජලයේදී ඔබ අවදානමක් ගන්න ලෑස්තිද?



අපි දන්නවා පිහීනීමට ඉතා දක්ෂ කෙනෙක්ට වුවද පිහිනීම අතරමගදී ශරීරයේ විවිධ අබාධ පැමිණිය හැකි බව. ඉතින් Kingii කියන්නේ පිහීනීමට දක්ශ වගේම පිහිනීම පුරුදු වන කෙනෙක්ට අවශ්‍යම ආරක්ෂක උපකරණක්. මෙය ඔබේ මැණික් කටුවෙහි පැළඳිය හැකියි. හිතන්න ඔබ ගැඹුරු ජලයේදී පිහිනද්දී කුමක් හෝ අපහසුතාවයක් මත පිහිනීම මොහොතකට නතර වුනා කියලා. මෙන්න මේ වගේ වෙලාවකදී තමයි අපිට මෙම උපකරණය වැදගත් වෙන්නේ. ඔබට පාවෙමින් සිටීමට උපකාර අවශ්‍ය නම්, **Lever** එක අදින්න, එවිට ඔබව මතුපිටට ඇද ගන්නා **inflation bag** එකක් මතු වේ. මෙය ඉතාම සරල තාක්ෂණයකින් නිමවූවක් වුවද එහි ඇති වටිනාකම නම් අඩුවක් නැත.

### Electronic Scanner - පාඩම් මගහැරුණු සිසුන් සඳහා



අපි දන්නවා පාසලේදී භාවිතා වන කලුලෑලිවල සටහන් තැබීමට ඇති ඉඩකඩ ඉතා සීමිත බව. එවිට ඇති විසඳුම වන්නේ සටහන් මැකීම සහ නැවත සටහන් කිරීමයි. පෙලක් සිසුන් සටහන් ලියාගැනීමේදි තරමක් මන්දගාමීයි. ඉතින් ඔවුන් මෙම සටහන් මැකීමේ ක්‍රියාවලියටනම් එතරම් කැමත්තක් නැහැ. එනිසා මේ ප්‍රශ්නයට වගේම තවත් බොහෝමයක් ප්‍රශ්නවලට විසඳුමක් ලෙස ජපානයේ සමහර පාසල්වල ඇති කළුලෑලිවලට electronic scanners සවි කර තිබෙනවා. එමගින් කළු ලෑල්ල මත ඇති සෑම සටහනක්ම ස්කෑන් කර එතුළ ගබඩා කර ගන්නවා. එම නිසා පාඩම් මගහැරුනු සිසුවකුට වුවද එම දත්ත නැවත භාවිතා කිරීමට හැකියාව ලැබෙනවා.

# ජනතා සුනාමිය නවත්වන්න ආණ්ඩුවට බැහැ



වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරු

## වසන්ත සමරසිංහ සහෝදරයා

***නියමුවා:- ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා රටින් පලා ගිය නමුත් අරගලය අවසන් වී නැහැ. මේ වන විට අරගලයේ ප්‍රමුඛ හඬ බවට පත්වී තිබෙන්නේ වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානයයි. මේ මධ්‍යස්ථානය ගොඩනැගෙන්නේ කොහොමද එහි සංයුතිය මොකක්ද කියලා මුලින්ම පැහැදිලි කළොත් ?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** මේ ක්‍රමයේ නියෝජිතයෙක් ලෙස රට බංකොලොත් කළ එක් අයෙක් තමයි ගෝඨාභය රාජපක්ෂ. ජූලි 09වැනිදා මේ රටේ සමස්ත මහා ජනතාව එකතු වී පන්නා දැම්මේ ඒ විධායක බලය දැරූ ගෝඨාභය රාජපක්ෂයි. මේ පළවා හැරීමත් සමග සමාජ පරිවර්තනයකුත් සිදුවෙයි කියලා බොහෝ දෙනෙක් කල්පනා කළා. මහින්ද රාජපක්ෂ ඇතුළු පවුල් පාලනය එළවන්න පාරට බැස්සේ ඒ නිසයි. ගෝඨාභය ඇතුළු රාජපක්ෂ පවුල් පාලනය පළවා හැරීමෙන් පැහැදිලි වෙන්නේ මේ පාර්ලිමේන්තුවත් එළවා දැමීමක් හා සමානම අදහසක්. නමුත් රාජපක්ෂ පවුල් පාලනය එළවා දැමූ ජන අරගලයේ ජයග්‍රහණ මේ වන විට පාවාදෙමින් තිබෙනවා. මේ නිසා සමාජය අපේක්ෂා කළ සමාජ පරිවර්තනය දක්වා වූ ජයග්‍රහණ අත්පත් කර ගත යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් වෘත්තීය සමිති ව්‍යාපාරයට විශාල කාර්යභාරයක් ඉතිරි වී තිබෙනවා. මෙන්න මේ කාර්යභාරය ඉටුකර ගැනීම සඳහා ගොඩනැගුණු මධ්‍යස්ථානය තමයි 'වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය', එහෙම නැත්නම් 'TUCC' කියලා හඳුන්වන්නේ. මේ මධ්‍යස්ථානය ගොඩනැගී තිබෙන්නේ මේ රටට ප්‍රගතිශීලී පරිවර්තනයක් සමාජ ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍රවලින් සිදුකළ යුතුයි කියලා ඒකායන අරමුණකින් කටයුතු කරන වැඩකරන ජනතාවගේ සංවිධානවල එකතුවකින්.

මේ වන විට රනිල් රාජපක්ෂ පාලනය අරගලයේ සිටි සියලු දෙනා මර්දනය කරමින් සිටිනවා. අනික් පැත්තෙන් අපේ රටේ ජාතික සම්පත් විකිණීමේ දැවැන්ත ක්‍රියාමාර්ග අනුගමනය කරන්න යොමු වී සිටිනවා. ඔවුන් මේ හැමදේම කරමින් ඉන්නේ මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටුකරන්නයි. මොන අභියෝග ආවත් අවසන් ජයග්‍රහණය දක්වා අරගලය ගෙන යන්න වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය භාරගෙන තිබෙනවා. රනිල් රාජපක්ෂලාගේ අරමුණත් මේ රටේ පොදු මහජනතාවගේ අරමුණුත් අතර තිබෙන්නේ විශාල පරතරයක්. දැන් ඉන්නේ ජනතාවගේ ජනාධිපතිවරයෙක් නොවෙයි. 134කගෙන් පාර්ලිමේන්තුවෙන් පත්වුණු ජනධිපති කෙනෙක්. ඒ නිසා මේ පාර්ලිමේන්තුව විසුරුවලා නව ජනමතයක් නියෝජනය වන පාර්ලිමේන්තුවක් තෝරා පත්කර ගැනීමේ සටනක් වෘත්තීය සමිති සම්බන්ධිකරණ මධ්‍යස්ථානයට තිබෙනවා. ඒ මූලික ඉලක්කය වෙනුවෙන් අපි සාමූහිකව කටයුතු කරමින් ඉන්නවා.

***නියමුවා:- අර්බුදයෙන් වැඩිම පීඩාවට පත්වෙන්නේ වැඩකරන ජනතාවයි. ඒ වගේම මේ සමාජ ආර්ථික බලවේගය තුළ විශාල ශක්තියක් පවතිනවා. මේ වැඩකරන ජනතාව අර්බුදයේ නිරීක්ෂකයන් විය යුතු නැහැ. ඔබ දකින විදිහට වඩා යහපත් දිශාවකට සමාජ ආර්ථික, දේශපාලනික, තත්වයන් පරිවර්තනය කර ගන්න වැඩකරන ජනතාව ස්ථානගත විය යුත්තේ කොතැනද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** පසුගිය අප්‍රේල් 03වැනිදා සිට රටේ සමස්ත ජනතාව එක්ක වැඩකරන ජනතාවත් අරගලය තුළ ස්ථානගත වී සිටිනවා. මේ රටේ මහජනතාවත් පාරට බහිනවා කීවාම ගෝඨාභය රාජපක්ෂ අප්‍රේල් 03වැනිදා ඇඳිරි නීතිය දැම්මා. ගෝඨාභයගේ ඇඳිරි නීතිය කඩලා මේ රටේ ජනතාව පාරට බැස්සා. මීට කලින් සියල්ල දෙස පැත්තකට වී බලා සිටි ජනතාව ඇඳිරි නීතියත් නොතකා පාරට බැස්සා. අප්‍රේල් 09 වැනිදා ගෝල්ෆේස් පිටියට ආවා. අප්‍රේල් 28 සමස්ත මහා වැඩ වර්ජනයක් කළා. ඒ වගේම මැයි 06 වැනිදා ලංකාව පුරා මහා හර්තාල් ව්‍යාපාරයක් පැවැත්වූවා. අපේ රටේ ඉතිහාසයට පමණක් නොවෙයි ලෝක ඉතිහාසයටත් සාර්ථකම හර්තාල් ව්‍යාපාරයක් විදිහට එය එකතු වෙනවා. ජනතාවගේ විශ්වාසය සාමකාමී අරගල කෙරෙහි ඉහළම මට්ටමකට පැමිණියා. මෙහෙම තියෙන අතරේ මැයි 09වැනිදා සාමකාමී අරගලයට පහර දෙන්න ආව රාජපක්ෂලාගේ මැරයන්ට මේ රටේ ජනතාව ඓතිහාසික පාඩමක් ඉගැන්වූවා. ප්‍රහාරයට එරෙහිව ප්‍රතිප්‍රහාරයක් එල්ල කළා. එතනින් නොනැවතී ජූලි 09 වැනිදා ගෝඨාභය රාජපක්ෂ එලවන ක්‍රියාමාර්ග දක්වා මහජනතාවත් එක්ක වැඩකරන පංතියේ ජනතාව ඒකාත්මික වී ක්‍රියා කළා.

> **මේ පාර්ලිමේන්තුවට ජනතාවට සහන දෙන්න බැරි නම්, ජාතික සම්පත් විකිණීම නවත්වන්න බැරි නම්, මර්දනය නවත්වන්න බැරි නම් මේකෙන් ජනතාවගේ මතය නියෝජනය වෙන්නේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව විසුරුවා හැර නව ජනමතයකට ඉඩ දෙන්න ඕනෑ.**

මේ සියල්ලෙන් නියෝජනය වුණේ පොදු මහජන විරෝධයයි. ගෑස් පෝලිම්, තෙල් පෝලිම්, වගේම දරුවන්ගේ අධ්‍යාපනය බිඳ වැටීම්, ජීවන වියදම් ඉහළ යාම වගේ සියලු පීඩනයන්ට විරුද්ධව ජනතා නැගී සිටීමක් සිදුවුණා. ණය ආපසු නොගෙවන බංකොලොත් රටක් බවට රට පත්කර තිබෙනවා. ධීවරයාට මුහුදු යන්න බැහැ. කර්මාන්තකරුවාට තමන්ගේ කර්මාන්ත පවත්වාගෙන යන්න බැහැ. ගොවියාට තමන්ගේ ගොවි බිම්වල වැඩකරගෙන යන්න බැහැ. ඒ නිසා මේ අර්බුදය නැවත වටයකින් දෙවැනි පිම්ම පනින්න පසුබිම සැකසී තිබෙනවා. මේ තත්වය යටතේ රනිල් රාජපක්ෂලාට ජූලි 09වැනිදා ගැන, මැයි 09 වැනිදා ගැන නැවත කියවා ගන්න කියලා අපි අවධාරණය කරනවා. ජන අරගලයක වුවමනාව ප්‍රශ්න විසඳා ගත් රටක ජීවත් වෙන්නයි. මේ ජන හඬට කන්නොදී යන්න පාලකයන්ට බැහැ. ජන මතය නියෝජනය නොකරන පාර්ලිමේන්තුවට එරෙහිව ජනතාව පෙළගස්වන්න අපි කටයුතු කර තිබෙනවා. මේ පෙළගැස්වීම අවශ්‍ය වෙන්නේ රනිල් රාජපක්ෂලා දැනටමත් රාජ්‍ය ආයතන 40ක් ප්‍රතිව්‍යුහගත කිරීමේ මුවාවෙන් විකුණා දමන්න දැනටමත් කටයුතු කර තිබෙන අලුත් පසුබිමකුත් නිර්මාණය වී තිබීම තුළයි.

විශේෂයෙන්ම අවධාරණය කරන්න දෙයක් මෙතන තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් මත දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට මුවාවෙලා සේවක අර්ථසාධක අරමුදලේ මුදල් කොල්ලකන්නත් මේ අය උත්සාහ කරමින් ඉන්නවා. මේවාට එරෙහිව සමස්ත වැඩකරන ජනතාව පෙළගැසෙමින් ඉන්නවා. අවසන් ජයග්‍රහණය දක්වා මහජන අරගලය ගෙනයන්න වැඩකරන ජනතාවගේ වෘත්තීය සමිති ව්‍යාපාරයට වගකීමක් තිබෙනවා. ඒ වෙනුවෙන් අපි අපේ කාර්යභාරය මේ වන විටත් නිවැරදිව ස්ථාන ගතකර අවසන්.

***නියමුවා:- TUCC එකෙන් අගෝස්තු 09වැනිදා ඒකාබද්ධ ව්‍යාපාරයක් ගොඩනැගීමේ ආරම්භය සටහන් කරමින් මහජන ආඥාවක් නිකුත් කළා. මේ නව ව්‍යාපාරයේ අවශ්‍යතාවය ඔබ අවධාරණය කරන්නේ කොහොමද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** අපි ඒ මහජන ආඥාව නිකුත් කරලා කීවේ ජනමතයක් නැති ආණ්ඩුව අරගලකරුවන් අත්අඩංගුවට ගැනීම වහාම නවත්විය යුතුයි කියලයි. අත්අඩංගුවට ගෙන සිටින සියලුදෙනා වහාම නිදහස් කරන්න කියලයි. සම්පත් විකිණීමට ගෙන යන වැඩපිළිවෙළ වහාම නවත්වන්න කියලයි. ඒ වගේම ජනතාවට සහන දෙන්න කියලයි. පාර්ලිමේන්තුව විසුරුවලා ජනමතයට අවස්ථාව දෙන්න කියලයි. මේ ආඥාව මත පදනම් වී අපි මේ වන විටත් විකිණීමට ආණ්ඩුව සූදානම් වන සියලු ආයතනවල වැඩකරන ජනතාව එක්ක සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. වරාය, තෙල් සංස්ථාව, විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, දුම්රිය, බැංකු, රක්ෂණ කියන ආයතන වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය හැටියට එකතු කරමින් ඉන්නවා.

ඒ වගේම සැබෑ ජන මතය නියෝජනය කළ යුතු යැයි කල්පනා කරන මහජනතාවත් අපි මේ සඳහා එකතු කර ගන්නවා. ඒ වගේම සමාජ පරිවර්තනයකට අවශ්‍ය වැඩපිළිවෙළක් සහිතව අපි සියලුම ජනතාවට ආරාධනා කරනවා. ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය ගොඩනැගුවේ මේ අරමුණින් යුතුවයි. මහජන ආඥාව නිකුත් කළේ මේ වෙනුවෙන් අවශ්‍ය කරුණු පෙළගස්වලයි. සැබෑ ජන මතයක් නියෝජනය කරන පාර්ලිමේන්තුවක් ලබාගැනීම වෙනුවෙන් සහ ආණ්ඩුවේ ජනතා විරෝධී ක්‍රියාමාර්ගවලට එරෙහිවත් ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය වැඩකරගෙන යනවා. ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවලට එරෙහිව ජනතාව ඉතාම වේගයෙන් එක්රැස්වෙමින් ජනතා සුනාමියකට පෙළගැසෙමින් සිටිනවා. ආණ්ඩුවට ඒක නවත්වන්න බැහැ.


***නියමුවා:- පුරවැසි ආඥාව තුළ අවධාරණය කළ සටන්පාඨ වල අවශ්‍යතාවය ගොඩනැගෙන්නේ කොහොමද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** මහජන අරගලයේ අභිලාශයන්ට එරෙහිව ආණ්ඩුව අරගලකරුවන් අත්අඩංගුවට ගැනීම දියත්කර තිබෙනවා. අරගලයේ දිශානතිය තීරණය කරන්නේ රනිල්ලා, රාජපක්ෂලා නොවෙයි. ඒ මොහොතේ පැන නගින තත්වයන් සලකා බලලයි. පොලිසිය බේරේ වැවට මිනිසුන් තල්ලු කළේ කවුද කියලා හොයන්න යනවා. නමුත් මහ බැංකුව කඩපු එකා පැහැදිලිව ඔප්පු වී තිබෙද්දී ඒ ගැන නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ජනාධිපති මැදුරේ පුටුවේ වාඩිවුණු කෙනා හොයන්න යනවා. සීනි බදු වංචනිකයන්ට විරුද්ධව පැමිණිලි කරලා තිබෙද්දී ඒ ගැන සොයන්නේ නැතිව ජනාධිපති මන්දිරයේ ගස්ලබු කෑව කෙනා හොයන්න යනවා. වස පොල්තෙල් ගෙනා අය හොයන්නේ නැතිව ජනාධිපති මන්දිරයේ වයිෆයි පාවිච්චි කරපු අය සොයන්න යනවා. මේ පොලිසියටත් යමක් කියන්න ඕනෑ. ඔබ මහජනතාවගේ සේවකයින් මිස මහජන දේපළ කොල්ලකෑවුන්ගේ සේවකයන් නොවෙයි. ඔවුන් දෙන හැම නියෝගයක්ම ක්‍රියාත්මක කිරීමට පෙර සමාජය දැන් තිබෙන්නේ කොතනද කියලත් කල්පනා කළ යුතු බව අවධාරණය කරනවා. අත්අඩංගුවට ගැනීම් වහාම නවත්වන්න කියන්නේ ඒ නිසයි. මේ ආණ්ඩුව එහෙම කරන්නේ නැත්නම් ඊළඟට ගොඩනඟන ආණ්ඩුවකින් නීත්‍යානුකූලව කටයුතු කරන බව අවධාරණය කරනවා.

මේ රටේ මහජන දේපළ විකුණන්නේ රට බංකොලොත් කර, ලෝකයේ කාගෙන්වත් ණය ගන්න බැරි තත්වයට පත්කර පසුව ඉතුරු ටිකත් විකුණා දමන්නයි. ඊට පස්සේ මොකද කරන්නේ? ආණ්ඩුව ට්‍රිලියන 13ක් දේශීයව ණය අරගෙන තිබෙනවා. එයින් ට්‍රිලියන

11 වැනි පිටුවට

# ගෝලීය බල අරගලයේ කේන්ද්‍රයක් වූ තායිවානය




එක්සත් ජනපදයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ (කොන්ග්‍රසයේ) කතානායක නැන්සි පෙලොසිගේ තායිවාන සංචාරයෙන් පසු ජාත්‍යන්තර දේශපාලනය යළිත් වරක් උණුසුම් වී තිබේ. යුක්රේන අර්බුදය අවසන් වීමට පෙරම එක්සත් ජනපදය ආසියානු කලාපය තුළ ගැටුමකට අවශ්‍ය ප්‍රකෝප කිරීම් සිදු කරමින් සිටිනු පෙනේ.

එක්සත් ජනපද රාජ්‍ය ධූරාවලියට අනුව තුන්වන ප්‍රධාන පුද්ගලයා වන ඇය අගෝස්තු 02 දින තායිවානයේ සංචාරයක නිරත වූයේ චීනය විසින් ඉදිරිපත් කළ රාජ්‍යතාන්ත්‍රික විරෝධතාද නොසලකා හරිමිනි. එය වසර 25කට පසු එක්සත් ජනපදයේ ඉහළ පෙලේ නායකයෙකුගේ ප්‍රථම තායිවාන සංචාරයයි. එම සංචාරයට නැන්සි පෙලොසි සමග තවත් කොංග්‍රස් මන්ත්‍රීවරු 06දෙනෙකු සහභාගි වී තිබුණි.

චීනය මෙම සංචාරය තම රටේ ස්වාධිපත්‍යය, ස්වෛරීභාවය, සහ භෞමික අඛණ්ඩතාවයට එරෙහිව සිදු කළ තර්ජනයක් ලෙසත් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කිරීමක් ලෙසත් චීනය හා එක්සත් ජනපදය අතර ඇතිකරගත් එකඟතා බිඳ දැමීමක් ලෙසත් සලකමින් ප්‍රතිචාර දක්වා තිබේ.

## තායිවාන ප්‍රශ්නයේ ඉතිහාසය

තායිවානය වර්ග කි.මී. 36,197ක වර්ග ප්‍රමාණයෙන් යුතු මිලියන 23ක පමණ ජනගහනයකින් යුතු හා ඉතිහාසයේ සිටම චීනයේ කොටසක් ලෙස සලකනු ලැබූ දිවයිනකි. 1624දී ඕලන්ද යටත්විජිතවාදීන් දකුණු දිග තායිවානය අත්පත් කර ගත්තද 1662දී ඔවුන් පළවා හැර එය යළිත් චීන පාලනය යටතට ගෙන තිබේ. 1885 සිට තායිවානය චීනයේ 20වැනි පළාත ලෙස සලකමින් පාලනය කර තිබේ. 1895දී ජපානය විසින් එය යටත් කර ගන්නා ලදී.

1943 දෙසැම්බර් 01 දින එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ එවකට චීන ජනරජය එක්ව කළ 'කයිරෝ ප්‍රකාශනයට' මගින් ජපානය විසින් තායිවානය නැවත චීනයට භාර දිය යුතුයැයි තීරණය කර තිබේ. 1945 ජූලි 26වැනි දින සිදු කළ 'පොස්ට්ඩෑම් ප්‍රකාශය' විසින් එය තහවුරු කර තිබේ. 1945 ඔක්තෝබර් 25 වන දින තායිවානයේ පාලනය තමන් අතට ගත් බව චීනය ප්‍රකාශ කළාය.

1949 ඔක්තෝබර් 01වන දින චීනයේ කුමිංතාන් හෙවත් ජාතික පක්ෂ පාලනය පෙරළා දමා චීනයේ කොමියුනිස්ට් පක්ෂය විසින් බලය තහවුරු කර ගනිද්දී චීන ජාතික පක්ෂයේ නායක චියන්කායිෂෙක් ඇතුළු පිරිස තායිවානයට පලා ගොස් එහි පාලනයක් පිහිටුවා ගත්හ. කොරියන් යුද්ධයේ ආරම්භයත් සමග එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධය අවසානයේදී ගොඩනගා ගත් එකඟතාවන් කඩ කරමින් තායිවානය තමන්ගේ ආරක්ෂාව යටතට ගැනීම හේතුවෙන් චීන සමාජවාදී විප්ලවය තායිවානය දක්වා ව්‍යාප්තවීම තාවකාලිකව නැවතුණි. එතැන් සිට 1971 දක්වා ලෝකය තුළ චීන ආණ්ඩු දෙකක් පැවතුණි. (ශ්‍රී ලංකාව මහජන චීන සමූහාණ්ඩුව හෙවත් සමාජවාදී චීනය පිළිගත් ප්‍රථම රටවල් අතරින් එකකි)

1971 වසරේ ඔක්තෝබර් මාසයේදී පැවති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 26වන සැසිවාරයේදී සම්මත කරගත් 2758 වන වගන්තිය අනුව චීන මහජන සමූහාණ්ඩුව (සමාජවාදී චීනය) චීන රාජ්‍යයේ එකම නියෝජිතයා ලෙස සැලකීමට තීරණය කරන ලද අතර ඒ දක්වා චියැන්කායිෂෙක් පාලනය එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ චීනයේ නියෝජිතයා ලෙස හෙබවූ සියලු ස්ථානයන්ගෙන් නෙරපා දමන ලදී. ඉන් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ චීන ආණ්ඩු දෙකක් හෝ චීනය සහ තායිවානය ලෙස රටවල් දෙකක් හෝ නොපැවතිනි. එතැන් සිට ජාත්‍යන්තර ප්‍රජාව චීනය සමග සබඳතා ගොඩ නගා ගත්තේ 'එක් චීනයක්' යන ප්‍රතිපත්තියේ සිටය.

චීනය සමග රාජතාන්ත්‍රික සබඳතා ආරම්භ කරමින් 1978 වසරේ දෙසැම්බර් මාසයේදී චීනය සහ එක්සත් ජනපදය අතර ඇති වූ අවබෝධතාවෙන් පසු නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශනයේදී එක්සත් ජනපදය 'එක් චීනයක්' යන ප්‍රතිපත්තියේ සිට කටයුතු කිරීමටත් තායිවානය චීනයේ කොටසක් ලෙස සැලකීමටත් එකඟතාව ප්‍රකාශ කර තිබුණි.

## චීනයේ ප්‍රතිචාරය

කෙසේ වුවද මෙවැනි තත්වයක තිබියෙදී සිදු වූ නැන්සි පෙලෝසිගේ තායිවාන සංචාරයට එරෙහිව චීනය කඩිනම් ප්‍රතිචාර දැක්විය. තායිවාන සමුද්‍ර සන්ධිය හා තායිවානය අවට මුහුදේ දින හතරක යුද අභ්‍යාසයක් පැවැත්වූ චීනය නැන්සි පෙලෝසිට එරෙහිව සම්බාධක පැනවීමට කටයුතු කළේය. ඒ අනුව ඇයටත් ඇයගේ ළඟම ඥාතීන්ටත් චීනය, හොංකොං හෝ මැකාවෝ දූපත්වලට ඇතුළු වීමට ඉඩ නොදෙන අතර ඔවුන් හා සම්බන්ද ව්‍යාපාරික ආයතනවලට එකී ප්‍රදේශවල ව්‍යාපාරික කටයුතු කළ නොහැකි වේ. එසේම චීනය බීජිංහි එක්සත් ජනපද තානාපතිවරයා කැඳවා සිය විරෝධය ප්‍රකාශ කළ අතර එක්සත් ජනපදයට වෙළඳ සම්බාධකද පනවන ලදී. මීට අමතරව චීන විදේශ අමාත්‍යංශය පහත සඳහන් ක්‍රියාමාර්ගද ගෙන තිබේ.

- චීන හා එක්සත් ජනපද හමුදා අණදෙන නිලධාරීන් අතර පණිවුඩ හුවමාරුව නවතා දැමීම
- චීනය හා එක්සත් ජනපදය අතර ආරක්ෂක ප්‍රතිපත්ති සම්බන්ධිකරණ සාකච්ඡා නැවැත්වීම
- චීනය හා එක්සත් ජනපදය අතර හමුදා නාවුක උපදේශක ගිවිසුම් සාකච්ඡා අවලංගු කිරීම
- නීති විරෝධී සංක්‍රමණිකයන් ආපසු ගෙන්වා ගැනීමේ එක්සත් ජනපද චීන සහයෝගීතාවය නවතා දැමීම
- අපරාධ කටයුතුවලදී නීතිමය සහය පිළිබඳ චීන එක්සත් ජනපද සහයෝගීතාව නවතා දැමීම
- අන්තර් ජාතික අපරාධ පිළිබඳ චීන එක්සත් ජනපද සහයෝගිතාව අත්හිටුවීම
- මත්ද්‍රව්‍යවලට එරෙහි සටනට අදාළ දෙරට අතර සහයෝගීතාව නවතා දැමීම
- පාරිසරික වෙනස්කම් පිළිබඳ චීන එක්සත් ජනපද සාකච්ඡා නවතා දැමීම

එක්සත් ජනපදය චීනය කෙරෙහි සතුරු ආකල්පයකින් කටයුතු කළද දෙරටෙහි ආර්ථිකයන් සැලකිය යුතු මට්ටමකින් එකිනෙක මත යැපේ. 2020 වසරේ සංඛ්‍යා ලේඛනවලට අනුව එක්සත් ජනපදය වැඩිම අපනයනයන් ප්‍රමාණයක් කරන රටවල් අතරින් කැනඩාවට (16.2%) හා මෙක්සිකෝවට (14.6%) පසු තුන් වන ස්ථානය (9.1%) ගන්නේ චීනයයි. එක්සත් ජනපදයට කෙරෙන ආනයනයන්ගෙන් 19.5%ක් එන්නේ චීනයේ සිටය. එසේම චීනයේ අපනයනයන්ගෙන් 16.5%ක් එක්සත් ජනපදය වෙත කෙරෙන අතර එක්සත් ජනපදය, ජපානයට (8.57%) හා දකුණු කොරියාවට (8.5%) පසු චීනයේ තෙවන (7.91%) විශාලතම ආනයනකරුය. 2021 වසරේදී එක්සත් ජනපදය ඩොලර් මිලියන 151.4ක අපනයනයක් චීනය වෙත සිදුකර ඇති අතර චීනයෙන් ඩොලර් මිලියන 504.9ක භාණ්ඩ ප්‍රමාණයක් ආනයනය කර තිබේ. එබැවින් චීනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් එක්සත් ජනපදයට නොසලකා හැරිය නොහැකි වනු ඇත.

එක්සත් ජනපදය හා චීනය අතර ඇති මෙම ගැටුම හුදු රටවල් දෙකක් අතර ගැටුමක් පමණක් නොවේ. එය මේ මොහොතේ අධිරාජ්‍යවාදයේ අර්බුදය ප්‍රකාශයට පත් කෙරෙන ආකාරයක්ද වේ. චීනය ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකයට හිමිකම් කියයි. ලොව ආර්ථික බලවතා වන එක්සත් ජනපදය, චීනය සමග අමුද්‍රව්‍ය, බලශක්තිය හා වෙළඳපොළ සඳහා තරගයක නිරතව සිටී. ධනවාදයේ අර්බුදය විසින් එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයෙන් පසුව ගොඩනගා ගත් ලෝක පරිමාණ බලය, විශේෂයෙන් සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු ගොඩනගාගත් තනි බලය දුර්වල කරමින් පවතී. ජාත්‍යන්තර සබඳතා ඒක කේන්ද්‍රීය ලෝකයක සිට බහු පාර්ශ්වික ලෝකයකට ගැලපෙන ලෙස සකස් වෙමින් තිබේ. එක්සත් ජනපද ආධිපත්‍යය දුර්වල කරමින් ලෝකය තුළ වෙනත් ආර්ථික හා දේශපාලනික බල කේන්ද්‍රයන් ගොඩනැගෙමින් තිබේ.


එක්සත් ජනපද අධිරාජ්‍යවාදය එය නිවැරදි ලෙස තක්සේරු කර ඇති අතර මතුවෙමින් තිබෙන ආර්ථික හා බල කේන්ද්‍රයන් දුර්වල කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග යන් තෝරමින් සිටි. 2022 මැයි මාසයේදී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ඇන්ටනි බ්ලිකන්, ජෝර්ජ් වොෂින්ටන් සරසවියේදී ජෝ බයිඩන් පාලනයේ ප්‍රතිපත්ති ගෙන හැර දක්වමින් ප්‍රකාශ කර සිටියේ වත්මන් ජාත්‍යන්තර බල තුලනයට වඩාත් බරපතළ දිගු කාලීන තර්ජනය වන්නේ චීනය බවයි. ඒ අනුව යමින් එක්සත් ජනපදය මේ මොහොතේදී චීනය දුර්වල කිරීම සඳහා කලාපය තුළ විවිධ චීන විරෝධී සන්ධානයන් ගොඩනගනු පෙනේ. උදාහරණයක් ලෙස සෞභාග්‍යය සඳහා ඉන්දු පැසිෆික් එකතුව, ඕකස් හා 'ඔණ්ඩ්' ආදී එකතුන්ද චීනය ආසන්නයේ ඇති රටවල් සමග (ජපානය, දකුණු කොරියාව , පිලිපීනය ආදී) යුදමය ගිවිසුම්ද සඳහන් කළ හැකිය. එක්සත් ජනපදය විසින් තායිවානය යොදා ගනිමින් සිටින්නේද ඒ සඳහාය.

## තායිවාන ප්‍රශ්නයේදී චීනයේ ප්‍රවේශය

තායිවාන ප්‍රශ්නයේදී චීනය කටයුතු කරමින් සිටින්නේ 'සාමකාමී ලෙස නැවත එක්සත් වීමේ' ප්‍රතිපත්තිය මත සිටයි. විශේෂයෙන්ම 1979 වසරේදී ඩෙන් ෂියාඕ පිං විසින් ඉදිරිපත් කළ 'එක් රටක් , ක්‍රම දෙකක්' ප්‍රතිපත්තිය අනුව යමින් පසුගිය කාලය මුළුල්ලේ තායිවානය හා චීනය අතර සබඳතා වර්ධනය විය. ඍජු තැපැල් හා දුරකථන පහසුකම් සැපයීම හරහා ඇරඹුණු එය 2000 වසර වන විට ඍජු ගුවන් ගමන් ආරම්භ කිරීම දක්වා වර්ධනය විය. 2015 වසරේදී චීන ජනාධිපති ක්ෂී ජින් පින් සහ තායිවාන් ජාතික පක්ෂයේ නායක මා යින්ග් ජෝ අතර හමුවක් පැවැත්විණි. (එය 1949න් පසු දෙපාර්ශ්වය අතර ඇති වූ ප්‍රථම හමු වීමය.)

එහෙත් මේවන විට තායිවානයේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රගතිශීලී පක්ෂය 'සාමකාමී ලෙස නැවත එක්සත් වීමේ' ප්‍රතිපත්තියට එරෙහිව බෙදුම්වාදී ස්ථාවරයක සිට කටයුතු කරමින් සිටියි. ඔවුන් 2016 වසරේ සිට තායිවානයේ ප්‍රධාන බල ව්‍යුහයන් තුළ තහවුරු වී සිටින බැවින් 'සාමකාමී ලෙස නැවත එක්සත් වීමේ' ක්‍රියාවලිය තවදුරටත් මන්දගාමී වී තිබේ. කෙසේ වුවද මෙම ප්‍රශ්නය විසඳා ගත යුතුව යුත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2758 වගන්තියට අනුව චීනයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් ලෙසටය; තායිවාන සමුද්‍ර සන්ධිය දෙපස ජීවත් වන ජනතාවගේ අභිමතය පරිදිය.

## බ්‍රසීලය: නැවතත් ලූලාට ඉඩ ලැබෙන හැඩ



ඔක්තෝබරයේදී පැවැත්විමට නියමිත ජනාධිපතිවරණයෙන් වත්මන් බ්‍රසීල ජනාධිපති බොල්සේනාරෝ පරාජය කරමින් බ්‍රසීල කම්කරු පක්ෂයේ ලූලා ද සිල්වා පළමු වටයේදීම ජයග්‍රහණය කරනු ඇතැයි ජනමත සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබේ. අගෝස්තු 18වන දින ප්‍රකාශයට පත් කළ Datafoha සමීක්ෂණ වාර්තාවට අනුව පළමු වටයේදීම ලූලා ද සිල්වා 51%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනු ඇත. බ්‍රසීල ජනාධිපතිවරණයේ පළමු වටය 2022 ඔක්තෝබර් 02වන දින පැවැත්වීමට නියමිතය.

## එක්සත් රාජධානිය: තැපැල් වර්ජනයට කම්කරු අනුමැතිය




එක්සත් රාජධානියේ රාජකීය තැපැල් සමූහයේ සේවකයින් ජීවන වියදමට සරිලන වැටුපක් ලබා ගැනීම සඳහා වන සිය වෘත්තීය අරගලය තීව්‍ර කිරීමට තීරණය කර තිබේ. ආයතනයේ කළමනාකාරිත්වය විසින් ලබා දීමට එකඟ වූ 2%ක සොච්චම් වැටුප් වැඩි වීමට විරෝධය පළ කරමින් රාජකීය තැපැල් සමූහයේ සන්නිවේදන සේවක සංගමය අගෝස්තු 26, 31 සහ සැප්තැම්බර් 8,9 යන දිනවලදී වැඩවර්ජනයේ යෙදීමට නියමිතය. මෙම වැඩවර්ජනය සඳහා තැපැල් සේවකයින් 115,000ක් පමණ සහභාගි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කළමනාකාරිත්වය සමග පැවති සාකච්ඡා අසාර්ථක වීමෙන් පසුව වැඩවර්ජනය අනුමත කරගැනීම සඳහා කම්කරුවන් අතර පැවති ඡන්ද විමසීමේදී 77%ක් සේවකයින් ඡන්දය ප්‍රකාශ කර තිබූ අතර ඉන් 98%ක් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර තිබුණි.

## එක්සත් ජනපදය: දුම්රිය සේවකයෝ වැඩවැරුමකට යන හැඩ




කාර්ය මණ්ඩල කප්පාදුව හා දුම්රිය සේවකයින්ගේ ජීවන තත්වය දිගින් දිගටම කඩාවැටීම හේතුවෙන් සැප්තැම්බර් මාසයේදී එක්සත් ජනපදයේ දුම්රිය සේවකයින් වැඩ වර්ජනයක් ආරම්භ කිරීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කර තිබේ. කොවිඩ් වසංගතය ආරම්භවීමෙන් පසු කළමනාකාරීත්වය හා දුම්රිය සේවකයින් අතර සාකච්ඡා නැවතිණි. මේ නිසා බොහෝ කාලයක් තිස්සේ ඔවුන්ගේ වැටුප් වැඩි නොවී පවතින අතර සේවා තත්වයන්ද අනාරක්ෂිත වී තිබේ. මේ වටපිටාව තුළ ලක්ෂයකට වැඩි දුම්රිය සේවකයින් සැප්තැම්බර් මාසයේ දී වැඩවර්ජනයක නිරත වනු ඇත.

## ඉන්දියාව: ඩොලර් අතහැර රුසියාව සමග ගනුදෙනු




ඉන්දියානු වෙළඳ සමාගම් රුසියාව සමග ගනුදෙනුවලදී ඩොලර් භාවිතා කිරීමෙන් ඉවත් වීමට තීරණය කර ඇතැයි RT පුවත් සේවය වාර්තා කළේය. මේ හේතුවෙන් ඉන්දියාවට අඩු මිලට ඛනිජ තෙල් , පොහොර ඇතුළු විශාල භාණ්ඩ ප්‍රමාණයක් මිලදී ගැනීමේ හැකියාව ඇති කරන අතර රුසියාවට බටහිර සම්බාධකවල බලපෑමෙන් තොරව ගනුදෙනු කිරීම සඳහා විශ්වාසනීය ගැනුම්කරුවෙකු ලැබී තිබේ. යුක්රේන යුද්ධය ඇරඹීමත් සමග එක්සත් ජනපදය හා යුරෝපා සංගමය රුසියාවට එරෙහිව සම්බාධක පැනවිය.

# "උන්න හැටියට මළා මදැයි" ආර්ථිකයේ වසර මැද වාර්තාව!

රාජපක්ෂලාගේ වික්‍රමසිංහ ආණ්ඩුව ආර්ථික අර්බුදය විසදීමට හොයාගෙන ඇත්තේ අපූරු විසදුම් ක්‍රමවේදයකි. සරල උදාහරණයකින් මෙය තේරුම් ගත හැකිය. කාමර 5ක් සහ සාලයක් ඇති විශාල ගෙයක් පරිහරණය කරන පුද්ගලයකු විදුලි බිල, ජල බිල, ඇතුළු නිවාසයේ නඩත්තුව පිළිබඳව අර්බුදයකට පත්ව ඇතැයි සිතන්න. ඔහුගේ ණය බරද දරාගත නොහැකි නමුත්, වියදම පාලනය දුර්වල, ආදායම අහිමි කරගෙන ඇති මේ ණයකාර නිවාස හිමියාට උදව් කිරීමට ද කිසිවෙකු නැත. දැන් ඔහු පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ කාමර 5ම වසා දමා එම කාමර වල ඇති බඩු මුට්ටු විකිණීමයි. ඔහුගේ ක්‍රියාමාර්ගය අනුව, ඔහුට දැන් කාමර 5ක් නඩත්තු කිරීමට යන වියදම ඉතිරි කරගත හැකිය. ඔහු දරුවන් හා ගෙදර ජීවත් වූ සියල්ලන් සාලයට කැඳවා සාලයේ රඳවා "ගෙදර" ලෙස දැන් හඳුන්වන්නේ මැද සලය පමණි.

ඒ සාලය පමණක් ඇති (කාමර වසා දැමූ) ගෙදර මෙන් ලංකාවද රාජපක්ෂලාගේ රනිල් වික්‍රමසිංහ විසින් දිනපතා වසා දමමින් මහජනතාවගේ ජීවත්වීම සීමා කරමින් නමුත් ලෝකයට පේන්න ගෙදරක් මෙන් රටක් පවත්වාගෙන යමින් තිබේ. විදුලිය සැපයීම කිරීමට නොහැකි වූ විට දෙගුණයකින් නොව හතර ගුණයකින් විදුලි බිල වැඩි කරයි. දැන් ජනතාව විදුලිය බිල වැඩි නිසා විදුලිය පරිහරණය නතර කළ යුතුය. ඉන්ධන සැපයීමට ආණ්ඩුවට නොහැකි නිසා ඉන්ධන සලාකයක් හදයි. දැන් සල්ලි තිබෙන අයට සලාකයේ (ෲ) සීමාව නිසා ඉන්ධන මිලදී ගත නොහැකිය. සල්ලි නැති අයට නැතිකම නිසා ඉන්ධන මිලදී ගත නොහැකිය. බෙහෙත් අර්බුදය විසඳුනේද එලෙසමය. පොහොර හොණ්ඩරය රු. 40,000 ට මිල ඉහළ දැමූ පසු පොහොර අවශ්‍යතාවය නැති විය. දැන් ඊළඟට ආහාර අර්බුදය විසදීමයි. රු. 8-10ට තිබූ බිත්තරය 60 කළේය. දැන් රණ්ඩුව පාලන මිල 60 ද 50 ක්ද යනුවෙනි. බිත්තර නිෂ්පාදකයින්ගේ සංගමය 50ට වැඩියෙන් ඉල්ලයි. ඇමති බැරිය කියයි. ජනතාව නරඹයි. ජනතාවට පේන විදියට ඇමති නියෝජනය කරන්නේ ජනතාවයි. නමුත්, රු. 50 දක්වා මිල ඉහළ ගියේ මේ ඇමතිලාගේම දේශපාලන තීරණ නිසා බව දැන් ජනතාවටද අමතකය. ඒ නිසා "උන්න හැටියට මළා මදැයි" ආර්ථිකයක් අද පවත්වාගෙන යාමට ආණ්ඩුව සමත්වී ඇත.

### තෙල් මවන මුදල්!

ආණ්ඩුවට මාර්තු මාසය දක්වා ඉන්ධන ගෙන්වීමට සිදුවූයේ ණය වාරිකද ගෙවන අතරේ ඉන්ධන සඳහාද මුදල් වියදම් කරමිනි. අප්‍රේල්වලින් පසු ආණ්ඩුව ණය නොගෙවා සිටීමට තීරණයකට එළඹුණි. ඒ අනුව ආසන්න වශයෙන් මාසයකට ඩොලර් මිලියන 400ක් බැගින් අගෝස්තු දක්වා ඩොලර් මිලියන 2000 ක් පමණ ණය වාරික හා පොලී ගෙවීම පැහැර හැරීමෙන් ආණ්ඩුව ඉතිරි කරගත් මුදලක් භාණ්ඩාගාරය සතුය. ස්වෛරී බැඳුම්කරවල කල්පිරීම නිසා ගෙවිය යුතු ඩොලර් මිලියන 1500ක්ද මේ වනවිට නොගෙවා ඇත. නමුත් දැන් මෙතෙක් ණය වාරික හා පොලියද ගෙවමින් ඉන්ධන සඳහා මුදල් සොයාගත් ආණ්ඩුවකට ණය හා පොලිය නොගෙවන තත්වයක් යටතේද ඉන්ධන සඳහාවත් මුදල් සොයා ගැනීමට නොහැකි තත්වය යටතේ අර්බුදයේ වත්මන් තත්වය වටහාගත හැකිය.

ලංකාව මේ වන විට ලෝකයේ ළමා මන්දපෝෂණය ඉහළම රටවල් අතරින් 6වන තැනට වැටී ඇත. දකුණු ආසියාවේම දෙවන ස්ථානය හිමිය. ණය ගෙවා ගත නොහැකි දැඩි ආර්ථික පීඩනය සහිත රටවල් අතරින් දෙවැනි වන්නේ. ආර්ජන්ටිනාව, වෙනිසියුලාව, ලෙබනය වැනි රටවල් කිහිපයකට පමණි. දැන් ණය නොගෙ වීමේ ප්‍රීතිය භුක්ති වින්දද කිසිදු රටකින් තාවකාලිකව වත් ණයක් ලබාගත නොහැකි මට්ටමට අසාදු ලේඛනයට වැටී අවසන්ය. සංචාරකයින් පැමිණෙන පාරාදීසයක්ව පැවති රටක් වන මේ මාතෘභූමියේ දැන් සංචාරක හෝටල් දිනපතා වැසී යයි.

මේ සියල්ල ස්වාභාවික හේතු මත සිදුවන අර්බුදයන් හෝ ජාත්‍යන්තර ආර්ථික සුනාමියක හේතු නිසා සිදුවන අර්බුද නොව පැහැදිලි ලෙසම පවතින ජරාජීර්ණ දූෂිත දේශපාලන බලයේ - දේශපාලන ක්‍රමයේ වැරදි නිසාම සිදුවන අර්බුදයන්ය. සාධාරණ මහජන නැගිටීම් කොතෙක් මර්දනය කළද ඒ අර්බුදයට සැබෑ විසදුම් නැති තාක් කල් අර්බුදයේ ප්‍රකාශනය මේ ආකාරයටම පවතිනු ඇත.

මේ අතර 2022 ආර්ථිකයේ වත්මන් තත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශය නිකුත් කරන "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳව වාර්තාව - 2022" නිකුත් වී ඇත. ඉහත පැහැදිලි කළ "උන්න හැටියට මළා මදැයි" පදනමේ සිට තීන්දු තීරණ ගන්නා පාලකයින් සහිත රටක ආර්ථිකයට සිදුවී ඇති නස්පැත්තිය පැතිකඩ කිහිපයකින් එම වාර්තාවෙන් සංඛ්‍යා දත්ත ලෙස දැක්විය හැකිය.

### ආර්ථිකය සමාලෝචනය

එම වාර්තාවේ සමාලෝචනයේ පළමු ඡේදය එලෙසම පිටපත් කිරීම වටී. " මෙතෙක් වාර්තා කළ ඉහළම උද්ධමන අගයන්, අත්‍යවශ්‍ය භාණ්ඩයන්හි හිඟය සහ බලශක්ති සැපයුමේ බාධාවන් සමගින් ශ්‍රී ලංකාව මේ වන විට පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. දේශීය වශයෙන් ඇති වූ අහිතකර තත්වයන් සහ ගෝලීය සැපයුම කෙරෙහි බලපෑ සාධක පවතින අර්බුදයට හේතු වී ඇත. ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ දිගින් දිගටම පවතින හිඟය, භාණ්ඩ මිල ඉහළ යාම සහ අඩු වූ විදේශ සංචිත, රුපියල විශාල ලෙස අවප්‍රමාණය වීමට හේතු වී ඇත. විදේශ ණය කල්පිරීම් පියවීම සහ අත්‍යවශ්‍ය ආනයන අවශ්‍යතා සපුරාලීම සඳහා සංචිත යොදා ගැනීම හේතුවෙන් භාවිත කළ හැකි විදේශ සංචිත ශූන්‍ය අගයක් දක්වා ළඟා වී ඇත. රාජ්‍ය මූල්‍ය තත්වය සැලකිය යුතු ලෙස දුර්වල වීම හේතුවෙන් රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටමකට පැමිණ තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහාය දක්වනු ලබන ආර්ථිකය යථාවත් කිරීමේ වැඩසටහනකට අනුකූල වන පරිදි ක්‍රමානුකූලව සහ ඒකාග්‍රතාවයෙන් යුතුව ණය ප්‍රතිව්‍යුහගත කරන තෙක්, තෝරගත් විදේශ ණය ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව රජය විසින් නිවේදනය කර ඇත."

මේ මෙතෙක් රජයේ මූල්‍ය වාර්තාවක රටේ ආර්ථිකය ගැන දේශපාලන දෘෂ්ටිය ඉක්මවා වාර්තාවූ පළමු අවස්ථාවකි. ආණ්ඩුව බොහෝ තීරණ ගෙන ඇත්තේ අශ්වයා ගිය පසු ඉස්තාලය වසන න්‍යායෙනි. 2022 අප්‍රේල් සිට ඩොලරයේ පාලනය කිරීමේ තීරණය වෙනස් කරන විට ඩොලරය කළුකඩයේ රු. 400ක් දක්වා මිල තීරණය වන මට්ටමකට පත්ව අවසන්ය.

★ කලින් ප්‍රතික්ෂේප කළ මිල සූත්‍රය ඉන්ධන මිල සඳහා යළි ක්‍රියාත්මක කරන විට ඉන්ධන ලබා ගැනීමට ඩොලර් නැති තරමට රටම හිඟමනට පත්ව පැවතිණි.

★ භාණ්ඩ මිල ඉහළ යාම කොතෙක්ද යත්, ආහාර මිල උද්ධමනය 2022 මැයි මාසයේදී සියයට 57.4 සිට 2022 ජූනි මාසය වන විට 80.1% දක්වා ඉහළ නගින ලදී.

★ භාණ්ඩ පරිභෝජනය ඉතා සීඝ්‍ර ලෙස කඩා වැටී ඇති තත්වය යටතේ ආහාර නොවන භාණ්ඩ සඳහා උද්ධමනයද මැයි මාසයේදී සියයට 30.6 සිට ජූනි මාසය වන විට 42.4%ක් දක්වා ඉහළ යන ලදී.

★ 2022 වසර ආරම්භයේ සිට මැයි 13 දක්වා මාස 5 ට පමණක් රුපියලේ වටිනාකම ඩොලරයට සාපේක්ෂව 44.3% කින් අවප්‍රමාණය වී ඇත.

★ කාර්මික අපනයනවල වර්ධනය ප්‍රතිශයක් ලෙස 2021 මුල් මාස 4 ට සාපේක්ෂව 2022 මුල් මාස 4 තුළ අපනයන වල ආදායම 11% කින් ඉහළ ගොස් ඇත. (2021 ඩොලර් මිලියන 3800 - 2022 ඩොලර් මිලියන 4219)

★ නමුත් දැඩි ආනයන පාලනයක් කර තිබියදීත් ආනයන සඳහා වියදමද 8.9% කින් කලින් වසරට වඩා මෙම වසරේ පළමු මාස 4 තුළ ඉහළ ගොස් ඇත. (2021 පළමු මාස 4 ට ආනයනය ඩොලර් මිලියන 6748 - 2022 එම කාලයේ ආනයනය ඩොලර් මිලියන 7350) ඒ අනුව 2021 පළමු මාස 4 තුළ වාර්තා වූ වෙළඳ ශේෂ හිඟය ඩොලර් මිලියන 2948 සිට 2022 පළමු මාස 4 තුළ එම අගය හිඟය ඩොලර් මිලියන 3131ක් දක්වා වැඩි විය.

### විදේශ විනිමය අර්බුදය

ලංකාවේ දෙවන විශාලතම විදේශ මුදල් ඉපයීම් ප්‍රභවය වන විදේශ ප්‍රේෂණ 2021 පළමු මාස 5 තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 2845.9 ට සාපේක්ෂව 2022 වසරේ පළමු මාස 5 තුළදී (සමාන කාලයේදී) ලැබීම ඩො. මිලියන 1335 ට පහළ වැටුණි. එය කලින් වසරට සාපේක්ෂව 53.1%ක පහළ වැටීමකි.

සංචාරක ඉපයීම, 2021 පළමු මාස 5 තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 39.9ට සාපේක්ෂව 2022 පළමු මාස 5 තුළ ඩො.මිලියන 680.7ක් දක්වා ඉහළ ගියද එය සාමාන්‍ය වාර්ෂික සංචාරක ඉපැයීම මට්ටම හා සැසඳීමේදී විශාල අඩුවීමකි.

### රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

රජයේ ආදායම - වියදම

2022 වසරේ රජයේ වියදම 83% කින් ආදායමට වඩා ඉහළ යාම නිසා රු බිලියන 524.1ක අයවැය හිඟයක් නිර්මාණය වී ඇති බව වසර මැද මූල්‍ය වාර්තාව පෙන්වා දෙයි. අයවැය හිඟය 2021 පළමු මාස 4 තුළ පැවැති බිලියන 520.5 ට සාපේක්ෂව 2022 පළමු මාස 4 තුළ බිලියන 524.1 ක් දක්වා ඉහළ ගොස් ඇත.

බදු ආදායම ඉහළ යාමේ ප්‍රතිඵල ලෙස 2022 පළමු කාර්තුවේදී රාජ්‍ය ආදායම බිලියන 631.1 ක් දක්වා 30.9% කින් ඉහළ ගොස් ඇත. ඒ තුළ ආදායම් බදු ඉහළ යාම ප්‍රධාන ලෙස කැපී පෙනේ. 2021 පළමු මාස 4 තුළ බිලියන 55.2 ක්ව පැවති ආදායම් බදු 2022 වසරේදී සමාන කාලයේදී රු. බිලියන 149.2 ක් දක්වා 170% කින් වැඩි වී තිබේ.


2021 පළමු කාර්තුවේ රාජ්‍ය වියදම රු. බිලියන 1003 ක් වූ අතර 2022 එම කාර්තුවේදීම රාජ්‍ය වියදම රු. බිලියන 1155 දක්වා 15.2% කින් වැඩි විය. රජයේ වියදම් උපරිම සීමාකරන ලද තත්වයක් තුළ වියදම ඉහළ යාමත්, ලබාගත හැකි උපරිම ආකාරයෙන් ආදායම එකතු කළද ප්‍රමාණවත් තරමේ ආදායම සපයා ගැනීමට නොහැකි වීමත් නිසා දේශීය වශයෙන් මූල්‍ය අර්බුදය උග්‍ර මට්ටමට පත්ව ඇත.

### පොලී ගෙවීම

ආණ්ඩුව ප්‍රතිපත්තියක් ලෙසම ණය ගෙවීම නතර කර තිබුණද පළමු කාර්තුව තුළ පසුගිය වසරට වඩා ණය හා පොලී වාරික හා පොලී ගෙවීම සිදුව ඇත. 2021 පළමු කාර්තුවේ ණය වාරික හා පොලී ගෙවීම රු. මිලියන 366.2 කට සාපේක්ෂව 2022 මුල් මාස 4 තුළ ණය වාරික හා පොලී ගෙවීම 426.8 දක්වා 16.5%ක් දක්වා වැඩි වී ඇත.

මෙම වාර්තාවේ කරුණුද පෙන්වා ඇත්තේ පසු ගිය වසරේ පළමු මාස 6 ට වඩා මේ වසරේ මාස 6 තුළ සමස්ත ලෙසම රටම කඩා වැටීමට ලක්ව ඇති බවයි. එසේම වඩාත් වැදගත්ම කරුණ වන්නේ වසර අවසානය මෙන්ම ඉදිරි වසරේද රටේ ආර්ථිකය යළි නිවරදි මාවතට එන මගක් නැති බවය. ඒ සඳහා වන පුළුල් දේශපාලන පරිවර්තනයක අවශ්‍යතාවය මේ මාස 6ක පරිහානිය විසින්ද ඔප්පු කරයි.





"වැරදීම් ඔබේ අත්දැකීම් ඉහළ නංවන අතර අත්දැකීම් ඔබේ වැරදි අඩුකරයි. ඔබ ඔබේ වැරදිවලින් පාඩම් උගෙන ගන්නා විට අන් අය ඔබේ සාර්ථකත්වයෙන් ඉගෙන ගනිති."

**අබ්දුල් කලාම්**



# වෘත්තීය අරගල පමණක් ප්‍රමාණවත් නැහැ ජනතාවාදී පාලනයක් ගොඩනැගීමට පෙළගැසෙමු

රේණුකා ලියනගේ සහෝදරිය
නියෝජ්‍ය ලේකම්, සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනය

රැකියාවල නියුතු කාන්තාවන් විදියට අපි සේවා ස්ථානය තුළ පීඩාවට පත් වෙනවා. වගේම නිවස තුළදීත් නැවතත් පීඩාවට පත් වෙනවා. 'වැඩ ඇරී වැඩට යති ගැහැනු' කියල කවි පද ලියවුණොත් ඒක නිසා වෙන්න ඇති. ඒ කොහොම වුණත් රටේ ජනගහනයෙන් 51% වුණු කාන්තාවන්ගෙන් 80%ක් පමණ විවිධ රැකියාවල නිරත වෙනවා. රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශය හා වතු ක්ෂේත්‍රය විදියට මූලික වශයෙන් බෙදා ගැනීමක් කර ගන්න පුළුවන්. එයට අමතරව අපිට අමතක කරන්න බැහැ වැටුප් නොලබා සේවය කරන, විශේෂයෙන් ඔවුන්ගේ සේවය අගය කිරීමකට ලක් නොවන කාන්තාවන් සෑහෙන පිරිසකුත් ඉන්නව කියලා.

මෙතෙක් කාලයක් රැකියාවල නියුතු කාන්තාවො විදියට අපි අරගල කළේ අපේ වැටුප් ඉහළ දමා ගැනීම්, නැතහොත් උසස් වීම්, ශ්‍රේණි භේද, සුභ සාධන ආදී වෘත්තීය අයිතිවාසිකම් පදනම් කර ගනිමිනුයි. ඒත් අද වෙනකොට මේ ආණ්ඩුවෙන් කිසිම දෙයක් ඉල්ලල වැඩක් නැහැ කියල රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ හා වතු ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු බොහෝ අයට දැන් වැටහී තියෙනවා.

ඒ නිසා සේවක ඉල්ලීම්වලින් ඔබ්බට ගිහින් ජන පීඩක පාලනයට එරෙහිව ජනතාවාදී පාලනයක් පිහිටවා ගැනීමට රැකියාවල නියුතු කාන්තාවන් විදියට නොපමාව අපි පෙළගැසිය යුතුමයි.





# වැඩ කරන කාන්තාවෝ පෙරට

මහ බැංකු හොරා යැයි චෝදනා ලැබූ තැනැත්තා දැන් රටේ ජනාධිපති වී ඇති නමුත් ඔහු ජනතාවගේ ජනාධිපතිවරයා නොවේ. ඔහු පාර්ලිමේන්තුවේ 134කගේ ජනාධිපතිවරයාය. රාජපක්ෂ පවුලේ ආරක්ෂකයාය. ඔහුට ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ වුවමනාවක් හෝ කැමැත්තක් නැත. එකම අභිප්‍රාය රාජපක්ෂ හොර මැර නඩය ආරක්ෂා කරමින් ඔවුන්ට එරෙහි වූවන් දඩයම් කරමින් ඔවුන්ගේ මනදොළ සැපිරීම පමණකි.

ඒ හැර රනිල් ජනාධිපති වූ නිසා කිසිවක් වෙනස් වූයේ නැත. ඉන්ධන පෝලිම් ඇතුවත් ඇත. නැතුවත් ඇත. එහෙත් ප්‍රමාණවත් ඉන්ධන නැත. ඇතැමුන් සිතා සිටියේ රනිල් වික්‍රමසිංහගේ ඉන්ද්‍රජාලික බලයකින් රටේ ප්‍රශ්න විසඳනු ඇතැයි කියාය. නමුත් හොරු රටවල් ගොඩනොනැගූ බවත්, බංකොලොත් කළ පාලකයන් විසින්ම යළි රටවල් ගොඩ නොනඟන බවත් බොහෝ දෙනාට නොවැටහීම ඛේදජනකය.

කෙසේ වෙතත් ලාංකේය ජනතාවගේ මෙවැනි සිතුම් පැතුම් වෙනස් කිරීම සිතන තරම් පහසු නැත. නමුත් එය කළ නොහැක්කක්ද නොවේ. ධනපති මතවාද ඉතා සූක්ෂම අයුරින් ජනතා ඔළුගෙඩි තුළට ඔබ්බවන වටපිටාවක් තුළ එය වෙනස් කිරීම අභියෝගයකි.

ඒ අභියෝගය අපි බාර ගැනීමට සූදානම්ය. 74 වසරක් පුරා රැවටුන පුරවැසියන් තවත් වතාවක් රැවටීමේ මාවතට පිවිසෙමින් සිටී. නමුත් ඒ පෙර තරම් පහසුවෙන් නොවේ. පෙර තරම් ප්‍රමාණයකින්ද නොවේ. අපි මිනිසුන් මිථ්‍යාවෙන් ගලවා ගනිමින් සත්‍යය වෙත ළඟා කළ යුතු වන්නෙමු. ඒ සඳහා ගොවි, කම්කරු, කාන්තා, ශිෂ්‍ය, තරුණ ආදී සියලු කොටස් බල මුළු ගැන්විය යුතුව තිබේ. ඒ වෙනුවෙන් අප දැනටමත් ශක්තිමත් පදනමක් දමා තිබේ. ඒ වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානයයි.

**හොරු රටවල් ගොඩනොනැගූ බවත්, බංකොලොත් කළ පාලකයන් විසින්ම යළි රටවල් ගොඩ නොනඟන බවත් බොහෝ දෙනාට නොවැටහීම ඛේදජනකය.**

රාජපක්ෂ පාලනය ගෙදර යැවීමේ අරගලයේ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරමින් වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වැඩ කරන ජනතාවට නායකත්වය දුන්නේය. 53 හර්තාලයට පසු සිදුකළ දැවැන්ත හර්තාල් ව්‍යාපාරය මෙහෙයවමින් වැඩ කරන ජනතාවගේ බලය පාලකයන්ගේ මුදල් බලයට වඩා ශක්තිමත් බව ඔප්පු කළේය. එතනිනුදු නොනැවතී අඛණ්ඩව රනිල් - රාජපක්ෂ පාලනය මුලිනුපුටා දැමීම වෙනුවෙන් ප්‍රමුඛ කාර්යභාරය ඉටුකරමින් හිඳියි.



දැන් සිදුවිය යුත්තේ නිවැරදි නායකත්වයක් යටතේ අරගලය ඉදිරියට ගෙනයාම බව අප මීට පෙරද පෙන්වා දුන්නෙමු. ඒ සඳහා නිවැරදි දේශපාලන නායකත්වයක් රටට තිබේ. එසේම සමස්ත වැඩ කරන ජනතාවට නායකත්වය දීමටත් ඕනෑම මොහොතක වෙනුවෙන් වැඩ කරන ජනතාව සීරුවෙන් තැබීමට සමත් වෘත්තීය සමිති ව්‍යාපාරයක්ද තිබේ. වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමග වෘත්තීය සමිති අති බහුතරයක් සම්බන්ධ වී සිටියි. ඒ සඳහා පාට පක්ෂ භේදයක් නැත. මේ දුර්දාන්ත පාලනය අතුගාදමා ජනතාවාදී පාලනයක් ගොඩනැගීම වෙනුවෙන් සියලු වෘත්තීය සමිති එක මිටකට ගොනුව සිටියි.

මේ අපූර්ව එකතුව සමග වැඩ කරන කාන්තාවෝ දස දහස් ගණනින් එක්ව හිඳිති. වැඩිපුර කාන්තා පාර්ශ්වය නියෝජනය කරන ඇඟළුම් ක්ෂේත්‍රය, වතු කම්කරු ක්ෂේත්‍රය, ගුරු ක්ෂේත්‍රය ආදියෙහි බහුතර කාන්තා නියෝජනය ටී.යූ.සී.සී. සමග එක්ව හිඳී. නමුත් තවමත් නිවැරදි දේශපාලනය තෝරා ගැනීමට නොහැකි වුණු, පාලකයන් වපුරන මිත්‍යාවන්ගේ ගොදුරු බවට පත්වන, පරණ පාලකයන් අලුතින් පැමිණ රට ගොඩනඟනු ඇතැයි සිතන කාන්තාවෝ විශාල පිරිසක්ද සිටියි. ඔවුහු දැන් ගෑස් ලිපෙන් දර ලිපට මාරුවී දැලි කුණු තවරාගෙන දාඩිය පෙරාගෙන උයන්නට හුරුවී සිටිති. ලයිට් බිල 75%ක් වැඩි වූ විට ගෙදර ලයිට් නිවා, වොෂින් මැෂින් එකේ රෙදි නොසෝදා, ශීතකරණය **off** කර තබා ඊට හුරුවීමට කැමැත්තෙන් සිටිති. බිත්තරය රුපියල් 60ක් 65ක් වන විට තම පවුලේ ප්‍රෝටීන් අවශ්‍යතාවය කපා හරින්නට හිත හදා ගනිති. ජනගහනයෙන් ලක්ෂ 70ක් පමණ ප්‍රමාණවත් තරම් ආහාර වේලක් නොලබා කුසගින්නේ හිඳින විට තමන් ඊට අයත් යැයි නොදැන හිත සනසා ගනිති. තම දරුවන් අධ්‍යාපනයෙන් ගිලිහී යන බව නොතේරී නොසෙල්මන්ව හිඳිති.

ඉතින් මඟ පෙන්වීම අවශ්‍ය මේ කාන්තාවන්ට නොවේද? මේ සාමාන්‍ය කාන්තාවන් නොව යම් ප්‍රමාණයක හෝ උගත්කමක් ඇති හෝ රැකියාවල නියුතු වූ හෝ කාන්තාවන් වීම විශේෂයකි. එබැවින් මේ පිරිස ටී.යූ.සී.සී. මගින් නිවැරදිව පෙළගැස්විය යුතුව තිබේ.

අපි දැන් විඳින්නේ ජීවිතයක් නොවන බව වැඩ කරන කාන්තාවන්ට අවබෝධ කරනු පිණිස වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සුවිශාල කාර්යභාරයක් ඉටුකරමින් හිඳියි.

දැන් සටන් අලුත් වටයකින්, අලුත් ජවයකින් ඉදිරියට ගෙන ආ යුතුය. ඒ සඳහා පෙරමුණ ගත යුත්තේ වැඩ කරන ජනතාවයි. ඒ අතර වැඩකරන කාන්තාවන්ගේ නියෝජනය අද්විතීය කාර්යභාරයක් ඉටුකරනු නිසැකය.

## සටන පණ දෙමු ගැහැනු නොබියව

පහන් පැය නිදි නොලබා
පාළුවට ගිය කුස්සියට වැද
අත පය හතර වුව
හනි හනික දර ලිපට ඔබලා
පස්වනක් ප්‍රීතියෙන් පිනලා
කන්තෝරුවට දුවනා

අදත් වට්ටක්කම ද
මඤ්ඤොක්කා කොළ මැල්ලුමට
කරවල කෑල්ලක් ආව නම්
පංකාදු පහයි හොද්දට
ළමයින්ට බිත්තරයක්
දුන් කලක් එන්නෙ නෑ මතකෙට
මසක් මාළුවක් නම්
ඇත්තෙම නැද්ද ඇත්තට

ලෙඩ ඇඳේ ඉන්න අම්මට
දොස්තර සස්ටජන් ලිව්වට
ඒක ගත්තොත් මුදලට
කන්නෙ කොහොමද
මෙහෙමවත් හෙට

ස්කූල් වෑන් බෑ දැන්
අපි බස් එකේ යන්නම්
ලොකු දූ කිව්ව තාලෙට
හුස්ම නැවතුනා වගේ මගෙ නම්

පොඩි කෙලී ගෙදරයි
ටියුෂනුත් හරි ඉහළයි
පාසලක දොර වැහුණත්
ශිෂ්‍යත්වෙ අඩු එක ලකුණයි

තියාගෙන ඔක්කොම කරදර
කන්තෝරුවට දිව්වට
චීන පටස් ගිලපු ලොක්කට
ජේන්නෙම නෑ හොඳක් කිසිවිට

පොඩි කාලෙ දුක් වින්දා
ඉගෙන ගෙන අපි බැන්දා
දරු මල්ලො හින්දා
රටක් ගැන අපි
හීන වින්දා

සැපක් නැති ජීවිත
පරඬැල වෙලා යනකොට
හීනෙකට පණ දෙන්න
එක හුස්මකට නොහැකිද
මුළුතැන් ගෙයට උරුමව
නොසිටා ලෝකය අභිමුව
හිනාවක් කැන්දන
සටන පණ දෙමු
ගැහැනු නොබියව

# දේශපාලනය පංති ඇසකින්...



"ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ පංති විඥානය ඇති පෙරමුණු බල ඇණියෙහි, නැතහොත්, කොමියුනිස්ට් පක්ෂවල, කණ්ඩායම්වල හා උපනතිවල හදිසි අරමුණ විය යුත්තේ, පුළුල් පොදු ජනතාව ඔවුන්ගේ නව ස්ථාවරයට පමුණුවනු පිණිස (තවමත් ඔවුහු බොහෝ කොටම උදාසීන, අක්‍රීය, නිදිගත සහ සිරිතට බැඳුණු පිරිසක් වෙති) ඔවුන්ට නායකත්වය දීමේ හැකියාව ලැබීමය. නැතහොත්, වෙනත් ආකාරයකින් කියතොත්, නව ස්ථාවරය කරා ඉදිරියට යාමේදී හා පරිවර්තනය වීමේදී තමන්ගේම පක්ෂයට පමණක් නොව, මෙම පොදු ජනතාවන්ටද නායකත්වය දීමේ හැකියාව ලැබීමය."

**ලෙනින්**

**තෝරාගත් කෘති, 10වැනි වෙළුම, 214 පිටුව**

වර්තමානයේ ලංකාව පාලනය කරන ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව ජනවරම අහෝසි කර ගත් එකකි. එසේම එය ජනවරමට පිටුපෑ ජනතා කැමැත්තට පයින් ගසා ව්‍යවස්ථාවේ සිදුරුවලින් රිංගා බලයේ සිටිනා එකකි. එබැවින් දැන් මෙම පාලනය මහජන කැමැත්ත නියෝජනය කරන හෝ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම හෝ නියෝජනය කරන්නක් නොවේ.

දැන් ලංකාවේ දේශපාලනය මතුපිටින් බලන විට පඹගාලක් සේය. රාජපක්ෂවරුන්ගේ ප්‍රතිවාදියා ලෙස පෙනී සිටි, නූතන දොන් ජුවන් ධර්මපාල ලෙස ඔවුන් විසින්ම වරෙක හැඳින්වූ රනිල් වික්‍රමසිංහ, ඔවුන් විසින්ම ජනාධිපති තනතුරට පත්කර තිබේ. රනිල් හිරේ යනතුරු තමන්ට නින්ද නොයන බව කී රාජපක්ෂවාදී හිටපු ඇමතිවරු දැන් රනිල්ගේ ගුණ ගයති; හැකියාවන් ගැන වර්ණනා කරති. ඒ අතර රනිල් රටේ සැබෑ අපරාධකරුවන් හා සමග එක්ව 'ආණ්ඩු කරන' ගමන් අරගලයේ සිටි පුරවැසියන් දඩයම් කිරීමට ඔවුන් පසුපස හඹා යමින් සිටී. රාජපක්ෂලා, රනිල් වික්‍රමසිංහලා හිරිකිතයක් නැතිව එකට එක්ව ජනයා පාලනය කරති. මෙය යමෙක් තේරුම් ගත යුත්තේ කෙසේද?

### නයි-මුගටි එක දණ්ඩේ

මහා ගංවතුරකදී නයි-මුගටි එක දණ්ඩේ ගොඩවන්නේ යැයි අපේ ගැමි වහරක් තිබේ. ඒ ජීවිතය බේරා ගැනීමටය. වර්තමාන දේශපාලනය ඒ ලෙසද තේරුම් ගත හැක. ජනතා විරෝධය නම් මහා ගංවතුර සුනාමියක් සේ ගැලූ දා, තම පංතිය හා පංතියේ එකිනෙකා ජනතා විරෝධයේ ගංවතුරින් බේරීමට එක දණ්ඩට (එක ආණ්ඩුවේ) ගොඩවීමට පටන්ගෙන තිබේ. ඒ ජනතාවට පෙණය පුප්පමින්ය.

රට තුළ සිදු කළ මහා වංචා - දූෂණවලට වැරදිකරුවන් කර, රාජපක්ෂවරුන් හිරේ දැමීමට වහසිබස් දෙඩූ රනිලුත්, මහා බැංකු බැඳුම්කර වංචාවට, පාස්කු ප්‍රහාරය වළක්වා නොගැනීමට වගකිව යුතු රනිල් හිරේ යැවීමට වේදිකා දෙවනත් කළ රාජපක්ෂ කල්ලියත්, එකට එක්වී වංචා-දූෂණ හා අපරාධවලට සැබෑ ලෙසම විරුද්ධ වූ අරගලකරුවන් හිරේ දමමින් සිටිති. ඒ සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතද යොදා ගනිති. ඒ පංති දේශපාලනයේ හැටිය.

මේ කලබගෑනිය දෙස බලා සිටින පොදු ජනයා සිදුවන්නේ කුමක්දැයි තේරුම් ගත නොහැකිව අන්දමන්දවී සිටිති; විවිධ මත ඉදිරිපත් කරති. සමහරු කලකිරීමටද පත්වෙති. 'මෙහෙම වුණේ ඇයි?' යනුවෙන් අසති. මේ තත්වය තේරුම් ගත හැක්කේ පංති දේශපාලනයේ අර්ථයෙන් පමණක් බව වර්තමානය විසින් ජනයාට උගන්වමින් සිටියි.

### ෆිදෙල් කී පරිදි

මෙවැනි තත්වයන් තේරුම් ගත හැක්කේ කෙසේද යන්න කියුබානු විප්ලවීය නායක ෆිදෙල් වරක් තමාගේම අත්දැකීම්වලින් මෙසේ පවසා තිබුණි. "මාක්ස්වාදය මට සමාජය යනු කුමක්දැයි ඉගැන්නුවා. මම ඊට පෙර සිටියේ දෑස් බැඳ, උතුර - දකුණ සොයා ගැනීමට නොහැකිව මහා වනයක අතරමංවූ අයෙක් ලෙසයි. ඔබ සැබෑ ලෙසම පංති අරගලයේ ඉතිහාසය තේරුම් ගත්තේ නැති නම්, අඩු ගණනේ සමාජය පොහොසත් හා දුප්පත් ලෙස බෙදී ඇති බව හා එක් පිරිසක් අනෙක් පිරිස සූරාකන බව පැහැදිලිව තේරුම් ගන්නේ නැති නම්, ඔබ කැලෑවක අතරමංවූ කිසිවක් නොදන්නා අයෙක් බවට පත්වෙනවා".

ඔහු එසේ පැවසුවේ දේශපාලනයේදී වල්මත් නොවී සිටීමට නම් දේශපාලනය හා සමාජය පංතිමය දෘෂ්ටියකින් වටහා ගැනීමේ වැදගත්කමය. පසුගියදා පාලකයන් පළවා හරිමින් රටේ සිදුවූ මහා ජනතා නැගිටීම එහි සම්පූර්ණ ජයග්‍රහණ අත්පත් කර ගැනීමෙන් තොරව අවසන් වීමට මේ තත්වයද බලපෑ බව කිව හැකිය. රටක් වැනසූ, සමාජ ක්‍රමය වෙනස් කිරීමට අවශ්‍ය දිශාවට අරගලය මෙහෙයවනවා වෙනුවට එක් පුද්ගලයෙක් (ගෝඨාභය) පළවා හැරීමේ ඉලක්කයට අරගලය ලඝුවීම හා සමහරු හිතාමතාම එලෙස අරගලය පටු කිරීම ඊට හේතුවයි. පංතිමය අරමුණු මත මෙම පොදු ජන අරගලය ඉදිරියේ බොරු වළවල් කපන අය තවමත් සිටින බව ජනතාව විසින් තේරුම් ගත යුතුව ඇත. ජනතා අරගලයේ ගමන්මග ඉදිරියේ බොරු වළවල් කපන අය සටනට පිටින් මෙන්ම සටන තුළද සිටින අතර එය වටහා ගත හැකි වන්නේද පංති අර්ථයෙන් ඒ දෙස බැලීමෙන් පමණි.

### මැතිවරණයේ දේශපාලනය

අප ආරම්භයේ දීම සඳහන් කළ පරිදි ලංකාව මේ මොහොතේ පාලනය කරනු ලබන්නේ ජනවරමක් නැති දුෂ්ට හවුලක් හෙවත් අශුද්ධ සන්ධානයක් විසිනි. එය එසේ වී ඇත්තේ ඇයි? 2019 දී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයට පත්වූයේ 69 ලක්ෂයක ජන වරමකිනි. ඉන්පසු පාර්ලිමේන්තු ඡන්දයේදී ප්‍රකාශ වූයේද එකී ජනතා කැමැත්තමය. එහෙත් පසුගිය මාස කිහිපයක් තිස්සේ ජනයා තමන් පත්කළ ආණ්ඩුවට එරෙහිව පාරට බැස අරගල කළ අතර ජූලි 09වැනිදා මහා ජන නැගිටීමකින් ජනාධිපතිවරයා පළවා හරින ලදී. එහි ප්‍රතිඵලය වූයේ ජනාධිපතිවරයා ඉල්ලා අස්වීමය. ජනවරමින් බලයට පත් ජනාධිපති ඉල්ලා අස්වූයේ අසනීප තත්ත්වයෙන් හෝ පෞද්ගලික හේතුවක් මත නොව ජනතා විරෝධය නිසාය. එසේ නම් දැන් රාජපක්ෂ පාලනයට ජනවරමක් නැත. එය අහෝසි වී තිබේ. එසේම ගෝඨාභයගේ ඉල්ලා අස්වීමෙන් පසු පාර්ලිමේන්තුවේ සිටි රාජපක්ෂ කණ්ඩායම විසින් ජනාධිපති තනතුරට පත්කර ගත් රනිල් වික්‍රමසිංහද ජනතාව මන්ත්‍රී ධුරයක්වත් නොදී ප්‍රතික්ෂේප කළ අයෙකි. එබැවින් ඔහුටද ජනවරමක් නැත. සත්‍යය එයයි.

එසේ නම් දැන් සිදු විය යුත්තේ ජනවරමකින් නව පාලනයක් පත්කර ගැනීමට ජනතාවට අවස්ථාව ලබාදීමය. ප්‍රජාතන්ත්‍රවාදය එයයි. එහිදී පවතින ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරණයක් දැන්ම පැවැත්විය නොහැක. එහෙත් මහ මැතිවරණයක් පැවැත්විය හැක. ඒ නිසා දැන් කළ යුත්තේ ජනවරම අහෝසි වූ පාර්ලිමේන්තුවට ඉල්ලා අස්වීමට බලකර, මහ මැතිවරණයක් දිනාගෙන ඒ මගින් නව ජනවරමකින් ජනතාව කැමති නව පාලනයක් බිහිකර ගැනීමය. එය ඉතාම තර්කානුකූලය. එලෙස අලුතින් පත්වන ආණ්ඩුවට පසුව ජනාධිපතිවරයාද වෙනස් කළ හැක.

### ඡන්දයට බය කවුද?

එහෙත් මහ මැතිවරණයක් දිනා ගැනීමට බාධාවන් රැසක් පවතී. ඒ, සමහරු ඡන්දයට බිය වී ඇති නිසාය. ඒ කවුද? එසේ වන්නේ ඇයි? යන්න තේරුම් ගත හැක්කේද පංති දේශපාලනයෙන්මය. වත්මන් පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රී කණ්ඩායම ඉක්මන් මැතිවරණයකට දක්වන්නේ මහා බියකි. ඒ ඊළඟ මැතිවරණයකදී පරදින බව ඔවුන් හොඳින්ම දන්නා බැවිනි. ඒ අනුව ඉතිරි අවුරුදු 03 කෙසේ හෝ සිටීමට ඔවුන් කැමතිය.

එසේම පාර්ලිමේන්තුවේ සිටින නවක මන්ත්‍රීවරුද ඉක්මන් මැතිවරණයකට කැමති නැත. ඒ වසර 05 සම්පූර්ණ කර ගැනීමට නොහැකි වුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප නොලැබෙන නිසාය. ඒවා තේරුම් ගත හැක. පංතිමය ඇසකින් බලනවිට තම පංතියේ පාලනය අහෝසි වනවාට ඔවුන් අකමැති වනවා සේම තමන්ගේ වරප්‍රසාද අහෝසි වනවාටද ඔවුහු කැමති නොවෙති.

නමුත් මහ මැතිවරණයකට බිය දක්වන්නේ ඔවුන් පමණක් නොවේ. දැනට පාර්ලිමේන්තුව නියෝජනය නොකරන හා පාර්ලිමේන්තුවට තේරී පත්වීමට තරම් ජන බලයක් නැති, අති වාමවාදී කුඩා කණ්ඩායම්ද පාර්ලිමේන්තු මැතිවරණයට බිය දක්වති. ඒ, එම සටන් බිමේ තමන්ට කිසිදු ජයක් අත්පත් කර ගත නොහැකි නිසාය. ඊට අමතරව ජාතික ජන බලවේගයට ඊළඟ මැතිවරණයකින් වඩාත් වාසිදායක තත්වයක් තිබීමද ඔවුන් බියට පත් කරන බව පෙනේ. ඒ දේශපාලන කුහකකම නිසාය. රනිල් ජනාධිපති වනවාට වඩා රාජපක්ෂලා තව වසර 03ක් සිටිනවාට වඩා ජාතික ජන බලවේගය ජය ගන්නවාට ඔවුහු අකමැති වෙති. එවිට ඔවුන් අනියමින් සේවය කරන්නේ රනිල්-රාජපක්ෂ පාලනයට බව සැඟවිය නොහැක. එම දේශපාලනය තේරුම් ගත හැක්කේද පංති ඇසකින් බැලීමෙන්මය. දේශපාලනයේදී අති වාමවාදී සටන් පාඨ බොහෝ විට ඍජුව හෝ වක්‍රව ධනේශ්වර දේශපාලනයට සේවය කරන බව ඉතිහාසය පුරා ඔප්පු වී තිබේ. පාර්ලිමේන්තුවට පිටින් හදන මහජන බලයක් වැනි ප්‍රායෝගික නොවන මනෝරාජික සටන් පාඨවලින් මෙම සත්‍යය වැසිය නොහැක.

### පෙරමුණු දෙකක්

දැන් මෙම දේශපාලන ගැටලුව විසඳා ගත හැකි වන්නේ කෙසේද? ඒ ජනතාව සටන් පෙරමුණු දෙකක එක්වර සටන් කිරීමෙන් හා එම සටන් පෙරමුණු දෙක ඒකාබද්ධ කර ගැනීමෙනි. එම සටන් පෙරමුණු දෙකෙන් පළමුවැන්න වන්නේ ජනතා අයිතීන් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මෙන්ම මැතිවරණයක් දිනා ගැනීම වෙනුවෙන්ද පාර්ලිමේන්තුවට පිටින් මහ පාරේ සටන් වදින පංති බලවේග නායකත්වයන් දෙන සටන් පෙරමුණය. දෙවැන්න පාර්ලිමේන්තුව තුළ හා දිනාගන්නා මැතිවරණ මගින් ජනතාවාදී පාලනයක් බිහිකර ගැනීම සඳහා ගොඩනගන පැහැදිලි දේශපාලන නායකත්වයක් ඇති මැතිවරණ පෙරමුණය. වර්තමාන දේශපාලන තත්වය තුළ සටන් පෙරමුණක් නැති හුදු මැතිවරණ පෙරමුණක්ද, එසේම බලය ගැනීමට මැතිවරණ පෙරමුණක් නැති හුදු සටන් පෙරමුණක්ද ප්‍රතිඵලදායක වන්නේ නැත.

පවතින බලය වෙනස් කර ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මහජන කැමැත්ත බලය බවට පත්වන නව පාලනයක් සඳහා මෙම පෙරමුණු දෙකම එකසේ වැදගත් වන අතර, මේ පෙරමුණු දෙක එකක් අනිකට සේවය කරමින් සටන් කළ යුතුය. දිනාගන්නා මැතිවරණයකින් පසු හා ඉන් පාලනයක් පිහිටුවීමෙන් පසුද මහජන සටන් පෙරමුණ පැවැතිය යුතු අතර නව පාලනය මුහුණ දෙන ගැටලු හා අභියෝග ජය ගනිමින් ජනතාවගේ පාලනය තහවුරු කර ගැනීමට එළියේ සටන් පෙරමුණ වැදගත් වේ.

මෙම දේශපාලන ගමන්මග හා උපක්‍රම නිවැරදිව තේරුම් ගැනීමේදී හා සතුරන් මිතුරන් හඳුනා ගැනීමේදීත් පංතිමය අර්ථයෙන් දේශපාලනය කියවා ගැනීම ඉතා වැදගත්ය.



> සටන් පෙරමුණු දෙකෙන් පළමුවැන්න වන්නේ ජනතා අයිතීන් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මෙන්ම මැතිවරණයක් දිනා ගැනීම වෙනුවෙන්ද පාර්ලිමේන්තුවට පිටින් මහ පාරේ සටන් වදින පංති බලවේග නායකත්වයන් දෙන සටන් පෙරමුණය. දෙවැන්න පාර්ලිමේන්තුව තුළ හා දිනාගන්නා මැතිවරණ මගින් ජනතාවාදී පාලනයක් බිහිකර ගැනීම සඳහා ගොඩනගන පැහැදිලි දේශපාලන නායකත්වයක් ඇති මැතිවරණ පෙරමුණය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක ළමයි එන්නත් කලින් කුකුළා අතේ අරන්ම පංතියට ඇවිත් හිටිය. ඩෙස් එකේ පැත්තකට බරවෙලා තනියම හිනා වෙවී මනෝ පාර ගහගෙන...

"ගුඩ් මෝනිං සර්... සර්" වසන්තිය ඉස්සර වුණත් අනුරුද්දියත් ඒකටම අත්වැල් අල්ලපු නිසා පැහැදිලිව ඇහුණෙ මුල 'ගුඩ්' කෑල්ලයි අග 'සර්' කෑල්ලයි විතරයි.

"ආයු...බෝ...වන්... ආයුෂ බොහෝ වේවා!" කෙටි කාලෙකට නෙමෙයි ළමයිනේ... ආයුබෝවන් කියන එක බොහොම බලගතුයි..." පොලිටික්ක හැපි එකේ කියනව.

"මොකද සර් අද හැපි මූඩ් එකේ. ස්වීප් එකක්වත් ඇදුණද?" කනියට ස්වීප් ගත්ත කඩේ හොයන්න යන්න තරම් හදිස්සිය.

"අසුබ දිනක ආ... සුබ පැතුමක් සේ..." කවුරු හරි සින්දුවකුත් මතක් කළා.

"එච්චර බරපතළ ඒවා හිතන්න එපා මේ දවස්වල..." මංජුව කනිය පැත්තට හැරුණත් කතාව හැමෝටම පොදු කළා. "ෂෙඩ් එකේ තෙල් තිබ්බත් ඇති කෙනෙකුට සතුටු වෙන්න"

"ඇත්තම කියන්න ළමයිනේ... ගිය සිකුරාදා මම තෙල් ගහගත්තනෙ පෝලිමක් නැතුව" පොලිටික්ක 'හැදෙන රට' ගැන සතුටෙ...

"මං කිවුවෙ... හොඳ වෙලාවට ආණ්ඩුව සර්ල ගැන හිතල තමයි පඩි වැඩි කරන්නෙ නැත්තෙ. නැත්තම් සතුට දරාගන්න බැරුව හාට් ඇටෑක් එකක්වත් එන්න පුළුවන්. එහෙනම් පෝලිම්වල නෙමෙයි බර ගාණක් මැරෙන්නෙ..." මංජුව හිපොක්‍රටීස්ට ඇන්ද.

"ගස් නැති රටේ එරඬු ගහත් ගහක්ලු. දැන් සතුටු වෙන්න ලොකු දේවල් ඕනෙ නෑ. තෙල් නැවකට ඕඩර් එක දැම්ම කිවුවම සතුටුයි. නැව වරායට ආව කිවුවම සතුටුයි. නැවට සල්ලි බැන්ද කිවුවම සතුටයි. තෙල් බානව කිවුවම සතුටුයි. තෙල් බෙදනව කිවුවම සතුටුයි. ෂෙඩ් එකේ තෙල් තියෙනව කිවුවම සතුටුයි" සමන තෙල් සතුටු චක්කරේ සම්පූර්ණ කළා

"දැන් ඒ සතුටත් හබක්. අන්න ආයෙත් තෙල් පෝලිම්..." මංජුව ආතල් කඩන්නන්ගේ සංගමය හදාගෙන.

"එතකොට බඩු ගේන එක තහනම් කළාම..." අනුරුද්දිය පේෂල් එකක්වත් දාගන්න බැරිවෙයි කියල බයේ.

"සතුටු චක්කරේ රිවස්... ඒ තහනම් බඩු අතරෙ කන බොන ඒවා තියෙනවා කිවුවම. අඳින පළඳින, ඇඟේ ගාන ඒවා තියෙනව කිවුවම... ගොඩනැගිලි ඉදිකිරීම් උපකරණ, වඩු උපකරණ, ගෙවතු උපකරණ, කුස්සියෙ උපකරණ, නිෂ්පාදන අමුද්‍රව්‍ය තියෙනව කිවුවම... සතුට, දුකට රිවස් වෙනවා. දුක ඩබල් වෙනවා. ඉකි ගැහෙනවා... ඇඬෙනවා... මේකෙ අන්තිමට තමයි මල පනින්නෙ..." සමන දුක්ඛ චක්කරේ කියන්න ගත්ත.

"දැන් ගෙන්නන්න තහනම් නැත්තෙ මොනවද?" කනියගෙන් කඩයිම් ප්‍රශ්නයක්.

"හොඳ ප්‍රශ්නයක්. තහනම් ඒවා 400ක් විතර දාන්න පිටු 93ක ගැසට් එකක් ගැහුව වෙලේ ගෙන්න පුළුවන් ඒවා දාලා පිටු දෙක තුනක ගැසට් එකක් ගැහුවනම් ඉවරයි" හොඳ වෙලාවට සමන මේක මෙතන කිවුවෙ... මුදල් ඇමති දැනගත්තනම් උපදේශකකමක් දීලා ගන්නව."

"ලංකාව තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ හබ් එක කරනව කිවුව නේද? අයි.ටී. යුගයට වේගෙන් යනව කිවුව නේද? අයි.ටී.වලින් ඩොලර් හොයනව කිවුව නේද? ඉතින් ඇයි කම්පියුටර් ගේන එක නැවැත්තුවෙ" ඒ ප්‍රශ්නෙ ආවෙ ලැප්ටොප් එකක් ගන්න සල්ලි එකතු කරන චමියගෙන්.

"දැන් ලැප්ටොප්, කම්පියුටර්, කැල්කියුලේටර් ගේන එක තහනම් කරලා තියෙන්නෙ අපිට දැන් ලොකු ගණන් හදන්න නැති හින්දනෙ... අපි ආහාර උද්ධමනෙ ලෝකෙ හතරවැනි තැන. ළමා මන්දපෝෂණෙන් ලෝකෙ හයවැනි තැන. දකුණු ආසියාවෙ දෙවැනි තැන... ආණ්ඩුව හිතනව ඇත්තෙ ඔය ඉලක්කම් ටික හදාගන්න දොඹ ගෙඩිවලින් හදපු ගණක රාමුවක් තිබ්බම හොඳටම ඇති කියල..." පොලිටික්ක ඇරෙන්න හැමෝටම හිනා ගියේ සමනගේ මනෝ ඇබකස් එකේ ගණන් හැදිල්ලට.

කවුළුව හැර තබමි

# සාහිත්‍යමය වෙස්ගැන්වීම හා යථාර්ථය...

මේ සාහිත්‍ය මාසයයි. ඉතිං සාහිත්‍ය උලෙළවල්, පොත් ප්‍රදර්ශන, සාහිත්‍ය කෘති, සාහිත්‍ය විචාර, කතිකාවන්, දේශන වෙනදා තරම් නැතත් සුපුරුදු පරිදි තැන් තැන්වල පිළිරුව් දෙනු ඇත. ඒ අතරම 'සාහිත්‍යය' යන සාධකය මාසයකට සීමා කළේ කවුරුන්ද, කුමකටද යන්න අපිට නම් ප්‍රහේලිකාවකි.

ආර්ථිකය විවෘත කිරීමේ ක්‍රියාවලිය තුළ සමාජයේ සෑම සියලු දේම ක්‍රියාත්මක වන්නේ මූල්‍යමය තත්වයන් හරහා බව නොරහසකි. මෙහි යථාර්ථය නම් සාහිත්‍ය, ප්‍රේමය, ආදරය, ගීතය මෙකී නොකී සියලුම සංස්කෘතික නිර්මාණයන් ඇගයීම සිදුවන්නේද මෙම මූල්‍යමය සිතීම මත බව යන්නය. වර්තමාන සමාජය තුළ එවැනි මූල්‍යමය සිතන්නෙකු නොවන කෙනෙකු සොයා ගැනීම අතිශය දුෂ්කරය.

පොදුවේ ගත් කළ සාහිත්‍යකරුවන්ටද එය අදාළ කරුණකි. සාහිත්‍යකරුවන් තම සාහිත්‍ය කෘති තුළ අතිශයින් මානවවාදී උත්තම චරිත ගොඩනංවා තිබෙන අයුරු බොහෝ විට අපට දක්නට ලැබෙන කාරණයකි. එමෙන්ම ඒවා හුදු සාහිත්‍යමය ගොඩනැංවීම් පමණක්ම වීමද ඊටත් වඩා සත්‍යයකි. පොදුවේ ගත් කළ සාහිත්‍යකරුවන් බහුතරයකගේ පෞද්ගලික චරිතාපදාන ගත් විට අර ඔහු හෝ ඇය විසින් ගොඩනංවන උසස් මානවීය ගුණයන්ගෙන් හෙබි මිනිසාට සිටින්නේ පරස්පරවය. සත්‍යම



කථාව 'සැබෑව' හා කල්පිත ගොඩනැංවීම් අතර මාරාන්තික පරස්පරයක් දිස්වීමය. මෙය මේ නරුම සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම, ධාරාවකටම අදාළ කරුණකි. නමුත් මේ පරස්පරය මකාදමා සැබෑ මානවවාදී, ජනතාවාදී සාහිත්‍යකරුවන් මේ සමාජය තුළ ඉඳහිට හෝ බිහි නොවන්නේය යන නරුම ආස්ථානයක අපි දෙපා තබා නොසිටිමු. එහෙත් එකක් කිව යුතුය. මේ දෙබිඩි මානවයා 'මිනිසෙකු' ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට නම් සමස්ත සැබෑ සමාජ පරිවර්තනයක් අවශ්‍යමය. ඒ වෙනුවෙන්ද සාහිත්‍යයට කළ හැකි වැඩ කොටස අතිවිශාලය.

# පරෙස්සම් වෙනු!...



දැන් ලංකාවේ මාධ්‍ය සංස්කෘතිය තුළ 'වම', 'දකුණ' යනුවෙන් භේදයක් නැත. පෙරදී 'ඇත්ත' පුවත්පත වමේය. 'සිළුමිණ' පත්තරය දකුණේය. සමසමාජ 'ජනදින' පත්තරය වමේය. ලංකාදීප පත්තරය දකුණේය. එබඳු බෙදීම් තිබුණු මාධ්‍ය සංස්කෘතික ඉතිහාසයක් අපට තිබුණි.

ධනවාදයේ මේ නූතන සමය තුළ අදහස්, අදහස් ලිවීම, පෙන්වීම සහ අදහස් කියවීම සහ අනුන්ගේ අදහස් කියවීම පවා පාරිභෝගික භාණ්ඩයක් වී තිබෙන නිසා ඊට අදාළ වෙළඳපොළ තුළ බොහෝ පිරිස් මුදල් ගරා ගැනීමට හා ගසාකෑමට සමත් වී සිටිති. හැමෝගෙම අදහස් යම්කිසි මිලක් සහිතව වෙළඳපොළට පැමිණ තිබේ. ඒත්තු ගන්වන්නේ ඔබට කැමති දේ මිලදී ගැනීමට හැකි බවය.

උදාහරණයක් ලෙසට උදේට රූපවාහිනී තිර මත පත්තර කියවන දසුන් දෙස හා කට්ටිය මඳක් සිහියට නංවා ගන්න. පිරිසක් වමේ වගේ ලියති; කියති. පිරිසක් දකුණේ වගේ ලියති; කියනවා. මේ දෙකම පැන නැගී ඇත්තේ එකම ආර්ථික විභවයකිනි. ඔවුහු ග්‍රාමීය ජනතාව මැදට ගොස් ජන දුක කියති; පෙන්නති; බඩු මලු බෙදති; උදවු කරති. ඒ සමගම ඊළඟ මොහොතේ පාලක පක්ෂයට කඩේ යති. පෙරදී අපි කලින් කී දේ කළේ වමේ අයය. දැන් වමත්, දකුණත් නියෝජනය කරන අදහස් එකම මූලයකින් මෙහෙය වෙනු පෙනෙයි. වෙනත් විධියකට කිවහොත් මේ දෙකම දැන් කරන්නේ ප්‍රාග්ධනයේ අයිතිකරුවන් විසිනි. එකම පිරිස එක් මොහොතකට වමේය. තව වෙලාවකට දකුණේය. ඉදින් සමහරුන් උතුර, දකුණ මාරු වී 'අන්දොස්' වී ඇති මෙන් මේවාට අහු වී සිටිති.

මෙයින් කියන්නේ කුමක්ද? ධනවාදයේ වත්මන් අවදිය තුළ ප්‍රාග්ධනයට තමන්ට විරුද්ධ අදහස් පවා පාරිභෝගික භාණ්ඩ බවට වේෂ නිරූපණය කර, වෙළඳපොළකරණයට ලක්කර මාර්කට් කිරීමට හැකි වී තියෙන බවය. මෑත කාලීන හොඳම උදාහරණය ගෝල්ෆේස් අරගලය සහ එහි අරගලකරුවන්ගේ ක්‍රියාකාරකම් ලිඛිත සහ විද්‍යුත් මාධ්‍ය විසින් ආලෝකමත් කළ ආකාරයය.

# ලුණුයි බතුයි කමුද රත්තරන්!...

'ණය ප්‍රතිව්‍යුහගත කරණය කරන්න බෑ. අපේ වත්කම් අපි පවරා ගන්නවා. නෙළුම් කුලුන , මත්තල ගුවන්තොටුපළ, නොරොච්චෝලේ බලාගාරයත් ඒ ගොඩේ තිබෙන අතර ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතන කිහිපයක්ද ණයට හිලව් ලෙස තමන්ට පවරා දිය යුතු යැයි චීනය විසින් ලංකා ආණ්ඩුවට අවධාරණය කර තිබේ. මේ මෙම දිනවල අපේ රටේ මාධ්‍යවල පළවන ආන්දෝලනාත්මක ප්‍රවෘත්තියකි. වෙනත් ආකාරයකට කිවහොත් චීනය විසින් ලංකාවේ පාලකයන්ට කර තිබෙන නවතම 'තග' දැමීමය.

මොළ හතේ මුදල් ඇමති රට කාබාසිනියා කර තම මල්ල පුරෝගෙන ගිය පසු ආසියාවේම කෘතහස්ත දේශපාලනඥයා, මහ මොළකාරයා, අති දක්ෂ රාජ්‍ය පාලකයා, රාජ්‍යතාන්ත්‍රික නායකයා, දැනට ලෝකයේ සිටින ප්‍රබලම දේශපාලන චරිතය ආදී නොයෙකුත් වර නැගීම් මගින් ඔසවා තැබුවාවූද මහජන මතය අංශු මාත්‍රයක් වත් නොමැතිව පාර්ලිමේන්තු 'බයිගේම්' එකක් මගින් රනිල් වික්‍රමසිංහ රටේ ජනාධිපති විය. කොටින්ම 'බටනන්දේ' වෙනුවට 'බටලන්දේ' ජනාධිපති විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ඇමෙරිකාව, චීනය, ඉන්දියාව, ජපානය ඇතුළු ලෝකයේ බලවත් රාජ්‍යයන් දැන් අපේ රට ගොඩගැනීමට පැන පැන සහයට එනු ඇතැයි පොහොට්ටුවේ ඉදිරිපෙළ ප්‍රවේණිදාසයෝ රනිල් වනමින්, ගුණ ගයමින් ඔල්වරසන් දෙන්නට වූහ. කොටින්ම වැඩේ ගොඩ යයි ඇතැම් ඉහළ මධ්‍යම පාංතික ජන කොටස්ද විශ්වාස කළහ. ගෝල්ෆේස් අරගලයද



ඔවුන්ට අමතක වී ගියේය. ඒ අතරම පස්වතාවක් රටේ අගමැති වූ රනිල් රටට කළ මහා විනැනැහියද එලෙසම අමතක වී ගියේය. දැන් රනිල්ගේ මහා ගජ මිතුරන් කියූ ලොව ප්‍රබල ධනේශ්වර රටවල් මෙන්ම අයිඑම්එෆ් ප්‍රමුඛ ලෝකයේ බලවත් මූල්‍ය ආයතනද රනිල්ගේ ගෙල මිරිකමින් කප්පම් ඉල්ලා තර්ජනය කරමින් සිටී. මේ කප්පම් ඉල්ලන්නේ රනිල්ගේ පෞද්ගලික බූදලයෙන් නොව ජනයාට ජීවත්වීමට තිබෙන රටේ සම්පත් හා දේපළවලිනි. මේ කප්පම් රනිල් - රාජපක්ෂ දෙමුහුන් පාලනය අනිවාර්යයෙන්ම ලබාදෙනු ඇත. මොවුන් මේ තරම්ම රටට වින කටිද්දීත් ඔවුන් ගැන තවත් බලාපොරොත්තු තබාගෙන සිටින මිනිසුන් වෙත් නම් ඔවුන් හඳුන්වාදීමට අපගේ ශබ්ද කෝෂයේ ප්‍රමාණවත් වචන නැත.

අගෝස්තු 12

# කඩා වැට්ටවූ අය විසින් ගොඩගත් රටක් නැහැ

ජාතික ජන බලවේගය පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා

*(ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ සභාව කල්තැබීමේ විවාදයට එක්වෙමින්)*

අපේ රට මේ නිශ්චිත මොහොතේ තිබෙන්නේ ඉතාමත් දරුණු ආර්ථික, සමාජීය අර්බුදයක. මේ අර්බුදයේ පදනම වන්නේ අපේ රටේ පවතින දේශපාලන සංස්කෘතියයි. මේ අර්බුදයෙන් ගොඩඒමට නම් මේ දේශපාලන සංස්කෘතියෙන් මිදීම සඳහා වූ දැක්මක් හා සැලැස්මක් අපට තිබිය යුතුව තිබෙනවා. එසේ නොමැතිව අපට කවර ආර්ථික සංවර්ධන යෝජනාවන් තිබුණත් ආර්ථික ප්‍රතිපත්තීන් තිබුණත් මේ අර්බුදයෙන් ගොඩඒමට නොහැකියි. මේ විනාශකාරී, නාස්තිකාරී, දූෂණ, තමන්ගේ බලය පමණක් කේන්ද්‍රකර ගත් දේශපාලන ව්‍යාපෘතියක් තබාගෙන කටයුතු කිරීම නිසා මේ අර්බුදයෙන් ගොඩඒමට නොහැකියි. ඒ වගේම සමහරුන් කල්පනා කරනවා විදේශීය සංවිධාන, මූල්‍ය සමාගම් සහ විදේශීය රටවල් විසින් අපව ගොඩදමා දෙයි කියලා. කඩා වැටුණු කිසිදු රටක් කිසිම සංවිධානයක් හෝ විදේශීය රාජ්‍යයක් විසින් ගොඩදමා දෙන්නේ නැහැ. අපි සමත් විය යුතුයි එම සංවිධානවල සහ එම විදේශීය රාජ්‍යයන්ගේ සහාය ලබාගැනීමට. හැබැයි මෙම ගොඩගැනීමේ ශක්‍යතාවය තිබෙන්නේ මේ රට තුළින් ඇතිකර ගන්නා වෙනසකින් විතරක් පමණයි. වෙන කිසිවෙක් මෙම අර්බුදයෙන් අපව ගොඩදමා දේවි කියා විශ්වාස නොකළ යුතුයි. අපේ රටේ මානව සම්පත, අපේ රටේ සම්පත්, අපේ රටේ පිහිටීම, අපේ ශිෂ්ටාචාරය, ලෝක දේශපාලනය මේ සියල්ල ඉතා හොඳින් මැනවින් කළමනාකරණය කරමින් අපේ ශක්‍යතාවය උඩට ගැනීමෙන් පමණයි මේ අර්බුදයෙන් ගොඩ ඒමට හැකිවන්නේ. ඒ වගේම ලෝක ඉතිහාසයේ සෑම තැනකම මෙවැනි කඩා වැටුණු අර්බුදයකදී ඒ කඩා වට්ටන්න දායකවූ අය විසින් කඩා වැට්වූ රටක් ගොඩ අරගෙන නැහැ. මෙවැනි කඩා වැටුණු දේශපාලන ව්‍යාපාර, ආණ්ඩු පමණක් නොවෙයි පොදු ජනයාගේ සක්‍රීය මැදිහත් වීමක් අවශ්‍යයි. එය දරා ගැනීම, කාර්යක්ෂමභාවය, මැදිහත් වීම, මේ සියල්ල සහිත පොදු ජනයාගේ මැදිහත්වීමක් අවශ්‍යයි. ඒ පොදු ජනයාගේ මැදිහත් වීම උද්දීපනය කරන්නේ කෙසේද? කිසිසේත්ම කඩා වැටීමට වගකිව යුතු අය මේ විනාශය ඇති කිරීමට මූලික වූ අය මුලසුනේ තබාගෙන පොදු ජනයාගේ  උද්දීපනයක් ඇති කරන්න බැහැ.

ලෝකයේ කඩා වැටුණු සෑම රටක්ම ඒ රටේ පොදු ජනයා උද්දීපනය කිරීමට නම් නව දේශපාලන මුහුණුවරක්, නායකත්වයක් රටකට අවශ්‍යයි. කඩා වැටුණු රටකට පොදු ජනයාගේ සක්‍රීය මැදිහත්වීම ලබා ගන්න නම් අනිවාර්යයෙන් ජනතාවගේ ජනවරමකින් ආණ්ඩුවක් හදා ගත යුතුයි. වර්තමාන තිබුණු රාජපක්ෂ ආණ්ඩුවට ජනවරම අහෝසි වී තිබෙන්නේ. එසේ නම් කළ යුතු වන්නේ කුමක්ද? මේ අර්බුදයෙන් ගොඩඒමට නම් අපේ රටේ ජනතාවට නව ජනවරමකට අවස්ථාවක් ලබාදිය යුතුයි. එතනදී ජනතාව කල්පනා කරනවා අර්බුදයක් තිබෙනවා, මේ අර්බුදයෙන් ගොඩගැනීම සඳහා තමයි අපි නව පාලනයක් ඇති කරගන්නේ කියලා. ඒ නිසා ඇතිකර ගන්නා පාලනයට නිසැක වශයෙන්ම අවුරුද්දකින් එකහමාරකින් විරාම කාලයක් ජනතාව විසින් ලබාදෙනවා. අද මේ ඇති කරගන්නා බහු පාර්ශ්වික හෝ සර්වපාක්ෂික හෝ ඇති කර ගන්නා පාලනයකින් ජනතාව පසුවදාම විසඳුම් බලාපොරොත්තු වෙනවා. හැබැයි මෙම අර්බුදයට



විසඳුම් ලබාදීමට මෙම පාලකයින්ට හැකියාවක් නැහැ. ඒ නිසා නව ජනවරමකට යමුයි කියා අපි යෝජනා කරනවා.

අපි දන්නවා පසුගිය රටේ තිබුණු ආර්ථිකය කඩා වැටීම හේතුවෙන් ඇති වූ කැළඹිලි තත්වය තුළ ජනවරමකට යා යුතු වීම අපහසුයි. එය අපි පිළිගන්නවා. ඒ නිසා අපි යෝජනා කළේ රට යථාවත් කිරීම සඳහා යම් සර්වපාක්ෂික ආණ්ඩුවක් ගොඩනගා ගැනීම. අපි එය මුළුමනින්ම පිළිගත්තා පමණක් නොවෙයි සියලු දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කළා. සර්ව පාක්ෂික ආණ්ඩුවක ප්‍රධාන කරුණු දෙකක් ගැබ්වී තිබෙනවා. එය පළමුවෙනි එක තමයි එම සර්වපාක්ෂික ආණ්ඩුවට දායක වෙන සෑම පක්ෂයකටම සාධාරණ අයිතියකින් නියෝජනය විය යුතුයි. මොකද තමන් කොටස්කරුවෙකු වෙනවා නම් එම සියලු තීන්දු තීරණවල තමන්ට වගකිව හැකි යාන්ත්‍රණයක් සර්වපාක්ෂික ආණ්ඩුවකට තිබිය යුතුයි. දෙවැන්න නියත වශයෙන්ම සර්වපාක්ෂික ආණ්ඩුවක් අන්තර්කාලීන විය යුතුයි. එය කෙටි කාලයක් විය යුතුයි. අපේ යෝජනාව ගැබ්වී තිබුණේ එතන.

සර්වපාක්ෂික ආණ්ඩුවට සහභාගී වන සෑම කෙනෙක්ම සාධාරණ සම කොටස්කරුවන් බවට පත්විය යුතුයි එහෙම කියන්නේ ජනාධිපතිවරයා අනාගත බල ව්‍යාපෘතියක නොයෙදෙන කෙනෙක් විය යුතුයි. ඒ ස්ථාවරය සඳහා අපි විශාල ප්‍රයත්නයක් දැරුවා. එම ස්ථාවරයට එන්න පුළුවන්කම ලැබුණා නම් අපි ආණ්ඩුවේ කොටස්කරුවන් වෙන්න අපි යෝජනා කළා. අග්‍රමාත්‍යවරයා සාමූහික එකඟතාවයෙන් තෝරා ගන්න එකඟතාවයකට ආවා. දසදෙනෙකුගෙන් අමාත්‍ය මණ්ඩලයක් පත්කර ගෙන රට යථා තත්වයට පත්කරගෙන මහ මැතිවරණයකට ගිහිල්ලා නැවත ජන වරමක් පිහිටුවිය යුතුයි කියන යෝජනාව තමයි අපි කළේ. මේ යෝජනා ඇතිව පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ සමග අපි සාකච්ඡා කළා. අපේ උත්සාහය අසාර්ථක වුණා. සර්වපාක්ෂික ආණ්ඩුව සඳහා වූ සියලු අවස්ථා දැන් අවසන් වී තිබෙනවා. දැන් රනිල් වික්‍රමසිංහ රාජපක්ෂ කඳවුරේ සහාය ඇතිව රනිල්-රාජපක්ෂ ආණ්ඩුව ගොඩනගනු ලැබුවා. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ මුලසුනේ සිට අපට ආරාධනා කරන්නේ කුමකටද? දැන් අපට ආරාධනා කරන්නේ රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ කොටස්කරුවන් බවට පත්වෙන්න. අපි ඒකට ලැහැස්ති නැහැ. නමුත් ආණ්ඩුව විසින් මේ අර්බුදයෙන් ගොඩඒම සඳහා යම් ආර්ථික වැඩපිළිවෙළක් ඉදිරිපත් කරනවා නම්, සාධනීය කරුණුවලට සාධනීය ප්‍රතිචාර දක්වන්න අපි ලැහැස්තියි.

ඊළඟට එතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගැන දීර්ඝ ලෙස පැහැදිලි කළා. ප්‍රජාතන්ත්‍රවාදය ඉතා වැදගත්. එහි මූලික දෙය මොකක්ද? අදත් අපේ රට පාලනය වෙන්නේ හදිසි නීතිය යටතේ. හදිසි නීතිය යනු කුමක්ද? මේ පාර්ලිමේන්තුව දීර්ඝකාලයක් තිස්සේ සම්මත කර තිබෙන සෑම නීතියක්ම අත්හිටුවීමේ බලතල ජනාධිපතිවරයාට ලැබී තිබෙනවා. වෙනස් කිරීමේ බලය ජනාධිපතිවරයාට තිබෙනවා. නව නීති පැනවීමේ බලය ජනාධිපතිවරයාට තිබෙනවා. ඒ නිසා ජනාධිපතිවරයා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කළාට ඔහු රට පාලනය කරන්නේ හදිසි නීතිය කේන්ද්‍ර කරගෙන. ඔහු මේ සාකච්ඡාවේදී මේ අරගලය කොටස් දෙකකට බෙදුවා. එක කොටසක් ත්‍රස්තවාදීන්. අනෙක් කොටස අරගලකරුවන්. ජනාධිපති පුටුවේ වාඩිවුණු කාන්තාවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත්තා. ඒ ත්‍රස්තවාදීන්ද? ජනාධිපති පුටුවේ කොඩිය දමාගෙන නිදාගනිපු කෙනා ත්‍රස්තවාදීන්ද? ජනාධිපති මන්දිරයට පළමුවෙන් ඇතුල් වූ කෙනා ත්‍රස්තවාදීන්ද? මොනවාද මේ විකාර. දැන් ජනාධිපතිවරයාට අවශ්‍ය වී තිබෙන්නේ තමන්ට ඡන්දය දීපු කඳවුර සතුටු කිරීමටයි. අන්න ඒක තමයි රනිල් වික්‍රමසිංහගේ ප්‍රජාතන්ත්‍රවාදය. ඔය පුටුවේ වාඩිවී ප්‍රජාතන්ත්‍රවාදය ගැන කීවාට ඔහු හදිසි නීතිය යටතේ සාධාරණ ජනතාවගේ නැගිටීම පිළිබඳව ඉතාමත් වියරුවෙන් සහ කෝපයෙන් කටයුතු කරන බව පෙන්නුම් කරමින් තිබෙනවා.

> ජනාධිපති පුටුවේ වාඩිවුණු කාන්තාවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත්තා. ඒ ත්‍රස්තවාදීන්ද? ජනාධිපති කොඩිය දමාගෙන නිදාගනිපු කෙනා ත්‍රස්තවාදීන්ද? ජනාධිපති මන්දිරයට පළමුවෙන් ඇතුල් වූ කෙනා ත්‍රස්තවාදීන්ද? මොනවාද මේ විකාර. දැන් ජනාධිපතිවරයාට අවශ්‍ය වී තිබෙන්නේ තමන්ට ඡන්දය දීපු කඳවුර සතුටු කිරීමටයි. අන්න ඒක තමයි රනිල් වික්‍රමසිංහගේ ප්‍රජාතන්ත්‍රවාදය.

ඊළඟ වංචා දූෂණ පිළිබඳව විශාල සාකච්ඡාවක් කළා. ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව ප්‍රකාශ කළා. දෙමළ කියමනක් තිබෙනවා "සාතන් වේදම් ..." ඒ කියන්නේ යක්කු ආගම් කියනවා. ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගේ කතාවේදි මට හැඟුණේ "යක්කු පිරිත් කියනවා" වගේ හැඟීමක්. දැන් වංචා දූෂණ පිළිබඳව මුලසුනේ සිට එතුමා කිවුවා.  මම දැන ගන්න කැමති නිමල් සිරිපාල සිල්වා අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වුණේ ඇයි? ලංකාවේ අමාත්‍යවරුන්ගේ වංචා-දූෂණ පිළිබඳව ඕනෑවටත් වැඩිය පත්තරවල ලියැවිලා තිබෙනවා. ගොසිප්වල ලියැවී තිබෙනවා. ඒ කිසිවෙලාවක ජනාධිපතිවරයෙක් ඇමතිවරයාට ඉල්ලා අස්වෙන්න කියා නියෝගයක් දී නැහැ. හැබැයි හිටපු රාජපක්ෂ ගෝඨාභය රාජපක්ෂ නියෝගයක් දුන්නා නිමල් සිරිපාල අමාත්‍යවරයාට ඉල්ලා අස්වෙන්න කියා. හැබැයි වර්තමාන ජනාධිපතිවරයා තිදෙනෙක්ගෙන් සමන්විත කමිටුවක් පත්කරනවා. කොහෙද වංචා-දූෂණ පිළිබඳව එළියේ කමිටුවල විභාග කරන්නේ. මෙසේ හිතුවොත් මේ කැලෑ උසාවියක්. කමිටුවේ සභාපති කුසලා සරෝජිනී. කුසලා සරෝජිනී එම කමිටුවේ සභාපති කරන ලෙස රනිල් වික්‍රමසිංහගෙන් ඉල්ලා සිටියේ නිමල් සිරිපාලමයි. ඒ කමිටුවෙන් ඔහුව සුද්ද කරනවා. ඊට පස්සේ ඔහුට ඇමති ධුර දෙනවා.

රනිල් වික්‍රමසිංහට මේ මුලසුනේ වාඩිවෙලා කියන්න පුළුවන්ද මම දූෂණය වංචාව මැඩපවත්වනවා කියලා. 'කටේ නරි වාදන් රෙද්ද පල්ලෙන් බේරෙනවා' කියන්නේ මේවාට තමයි. මේ නිසා අපට ඔහු වංචා, දූෂණ වැළැක්වීමට කටයුතු කිරීමේ ප්‍රකාශය පිළිගැනීමට නොහැකියි. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාවට බාධා කළේ රනිල් වික්‍රමසිංහයි. එතුමා මේ රටේ පාර්ලිමේන්තුවේ අවුරුදු 45ක්. එයින් අවුරුදු 43ක් අගමැති, එක්කෝ කැබිනට් ඇමති, එක්කෝ විපක්ෂ නායක. අද මේ රටේ ජනතාව බුක්ති විඳිමින් ඉන්නේ එදා එතුමා මේ රටේ වපුරපු බීජ. ඒ නිසා අද එතුමා වපුරන බීජ අනාගතයේ කවරාකාර විනාශයක් ගෙනදේවිද කියා අපට පැහැදිලියි.

## ජනතා සුනාමිය...

05 පිටුවෙන්

තුනක් අරගෙන තිබෙන්නේ සේවක භාරකාර අරමුදලෙන් සහ සේවක අර්ථසාධක අරමුදලෙන්. මේ ණයයෙන් 20%ක් අයි.එම්.එෆ්. බලකිරීමේ අනුව කපා හරින්න ලැහැස්ති වෙනවා. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවලින් මේ රටේ බැංකු මගින් ණය අරගෙන තිබෙනවා. ඒ වගේම තනි තනි පුද්ගලයෝ භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල ආයෝජන කර තිබෙනවා. මේ ඔක්කෝම එකතු වුණාම කෝටි ලක්ෂ දෙකහමාරක් කපන්න ආණ්ඩුව ලැහැස්ති වෙනවා. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනවා කියන්නේ ඒකට. මේකෙන් කෝටි හැත්තෑ පන්දාහක් පමණ සේවක අර්ථසාධක අරමුදලේ සල්ලි. අපි කියන්නේ ඒකට අත නොතියා බැරි නම් බැහැලා යන්න කියලයි. පාර්ලිමේන්තුව විසුරුවලා නව ජනමතයකට ඉඩ දෙන්න. එහෙම නැතිව සම්පත් විකුණලා මිනිසුන්ගේ අරමුදල් කොල්ලකාලා යන්න දෙන්න බැහැ.

මේ පාර්ලිමේන්තුවට ජනතාවට සහන දෙන්න බැරි නම්, ජාතික සම්පත් විකිණීම නවත්වන්න බැරි නම්, මර්දනය නවත්වන්න බැරි නම් මේකෙන් ජනතාවගේ මතය නියෝජනය වෙන්නේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව විසුරුවා හැර නව ජනමතයකට ඉඩ දෙන්න ඕනෑ. ජනතාව විසින් අලුතින් තෝරා ගන්නා පාර්ලිමේන්තුවකින් රට නව දිසානතියකට ගෙනයන්න කටයුතු කරාවි.

***නියමුවා:-** අරගලය සම්පූර්ණ කිරීමේ වගකීම ඔබද සම කැඳවුම්කරුවෙකු වී සිටින TUCC එකෙන් පවරාගෙන තිබෙනවා. ඔබේ සංවිධානය ඉදිරියේ තිබෙන අභියෝග ජය ගැනීමේ වැඩපිළිවෙළ කවරාකාරද?*

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** ඕනෑම අරගලයක අරමුණු ජයග්‍රහණය කර නැත්නම් නැවත අරගල මතුවෙනවා. ඒ අරගලයේ ස්වභාවය, එහි සීමාවන්, දින වකවානු ආදිය හාන්සිපුටුවල ඉඳලා තීරණය කරන්න බැහැ. ඒක තීරණය වෙන්නේ අරගලයට සම්බන්ධ වුණු ජනතාව. දැන් වෙලා තිබෙන්නේ රාජපක්ෂලා රනිල් එක්ක ඩීල් දාලා රාජපක්ෂලාගේම කැබිනට් මණ්ඩලය පත්කර ගැනීමයි. මේ නිසා අරගලය නැවත වටයකින් පැමිණෙනවා. අරගලයෙන් මේ වන විට ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් ගත්තා. නමුත් ඒ සමාජය ඒ ජයග්‍රහණ අවසන් කර ගැනීමේ වුවමනාවක පසුවෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්නේ පාලකයන් පැන්නුවාට පස්සේ අලුත් පාලනයක් පිහිටුවා ගන්න ජනතාවට අවස්ථාව දෙන්න ඕනෑ කියලා. දැන් සිදුවී තිබෙන්නේ ජනතාව කැමති පාලනයක් ගොඩනැගමේ අවස්ථාව රනිල් රාජපක්ෂලා විසින් අහුරා තිබීමයි. අරගලයේ අවසන් අරමුණු වෙනුවෙන් පාර්ලිමේන්තුවෙන් විසුරුවීමට බලකරන දැවැන්ත ජනතා පෙළ ගැස්මක් නිර්මාණය කිරීමට අපි කටයුතු කරමින් ඉන්නවා. මේ රටේ මහජනතාව ගල් කැටයක්වත් නොගෙන ඇවිත් ජනාධිපතිවරු පළවා හැරි මිනිස්සු. නැවත වතාවක් එන්නෙත් ගල් කැටයක්වත් නැතිව. මේ රටේ ආරක්ෂක අංශවලට අපි අවධාරණය කරන්නේ ඔබට අණ දෙන්නේ මේ රටේ ජනතාවගේ පාලකයන්ද ජනතාව ප්‍රතික්ෂේප කළ ජනතා ද්‍රෝහීන්ද කියලා කල්පනා කරන ලෙසයි. ඔබට ලැබෙන අණ නීත්‍යානුකූල නොවෙනවා නම්, එය නොකිරීමේ අයිතිය ඔබට තිබෙනවා.

ජනාධිපති කාර්යාලයට ඇතුල් වී රැස්වීමක් කළා කියලා අපිවත් උසාවි කැඳවා තිබෙනවා. ජනාධිපති ලේකම් කාර්යාලය ජනතාව විසින් අත්පත් කර ගත්තා. ගෝඨාභය රටින් පැන ගියා. ජනතාව අත්පත් කර ගත් ජනාධිපති ලේකම් කාර්යාලයේ රැස්වීමක් පවත්වන්න ඒ ජනතාවගෙන් අවසර තිබෙනවා නම්, ගෝඨාභයගෙන් හරි රනිල්ගෙන් හරි අවසර ගන්න ඕනෑ නැහැ. ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරලා අමාරුවේ වැටෙන්න එපා කියලා පොලීසියට අවධාරණය කරනවා. සාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක කරන දවසක ඔබට උසාවිවලට එන්න වෙවි, කියලා අපි අවධාරණය කරනවා. මේ රටේ වරාය, දුම්රිය, බැංකු, කර්මාන්ත ශාලා දුවවන්නේ වැඩකරන ජනතාව. ඔවුන් මේ වෙනකොට ජීවත් වෙන්න බැරි තත්වයකට පත්වී සිටිනවා. ඒ වගේම රටේ ජනතාව තවමත් ඉතාම ඉවසීමෙන් කටයුතු කරමින් ඉන්නවා. වැඩ කරන ජනතාව, රටේ සමස්ත ජනතාව සමග එකතු වී, මේ රට තවදුරටත් විනාශ කරන්න රනිල් රාජපක්ෂට ඉඩ දෙන්නේ නැහැ. අවසන් ජයග්‍රහණය දක්වා අරගලය ගෙන යන්න නායකත්වය දෙන්න වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සූදානම්. මේ බිමේ නව නිදහස් සමාජයක් බිහි කිරීමේ අවසන් ජයග්‍රහණය දක්වා අපි කටයුතු කරන බව අවධාරණය කරනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




රාජ්‍ය මර්දනයට එරෙහිව හඬ නගා... ජිනීවා



ජන ගොවිපොළ අස්වද්දමින්... බදුල්ල



ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහකොමසාරිස් හමුවී



සම්බාධක පිළිබඳ කියුබානු වාර්තාව එළිදක්වා...



ගොවි ගැටලු ගැන හඬ නගා... ආණමඩුව

## පාර්ලිමේන්තුව විසුරුවනු! නව ජනවරමකට ඉඩදෙනු! ‘අරගලයේ ජන බලය’ නුගේගොඩ රැලිය

# ජාතික ජන බලවේගය අරගල කරන්නේ සමස්ත ජනතාවගේ අරමුණු දිනවීමටයි



ජාතික ජන බලවේගයේ නායක

**අනුර දිසානායක සහෝදරයා**

මේ වන විට රට නිශ්චිත වශයෙන් කඳවුරු දෙකකට බෙදී තිබෙන බවත් බලය ඩැහැගත් අපරාධකාරයින් හා වංචනිකයින් සහිත රනිල් රාජපක්ෂ කඳවුර මහජන ධනය වියදම් කරමින් තමන්ගේ පැවැත්ම තහවුරු කරගෙන තිබෙන බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා, එම දූෂිත කඳවුරට එරෙහිව ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් පෙළගැසී සිටින බවත් රට ගමන්කරමින් තිබෙන ආර්ථික දේශපාලන මාවත වෙනස් කිරීමට පෙළගැසෙමින් සිටින සමස්ත ජනතාවගේ අරමුණු ජයග්‍රහණය කරවීම වෙනුවෙන් ජාතික ජන බලවේගය අරගල කරමින් සිටින බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 20වැනි දින නුගේගොඩ පැවති විරෝධතා පාගමනින් අනතුරුව ආනන්ද සමරකෝන් එළිමහන් රංගපීඨයේ පැවති ‘අරගලයේ ජන බලය’ රැලියේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

“ජාතික ජන බලවේගය සමස්ත ජනතාවගේ අරමුණු වෙනුවෙන් අරගල කරමින් ඉන්නවා. නිශ්චිත මතවාදයක්, ඉලක්කයක් සහිතව සාමූහිකව වැඩකරන, ඉතාමත් දුෂ්කර තත්වයක් යටතේත් නුගේගොඩ මහා හිස්ගොඩක් බවට පත්කළ හැකි වූයේ ජාතික ජන බලවේගයට පමණයි. දැන් රටට නව ජන වරමක් අවශ්‍යයි. වංචනිකයන්ට දූෂිතයන්ට දඬුවම් දෙන, හොරු රකින පාලනයක් වෙනුවට හොරු අල්ලා දඬුවම් දෙන පාලනයක් වෙනුවෙන් නව ජනවරමක් අවශ්‍යයි. ඒ වෙනුවෙන් අපට අරගලයක් තිබෙනවා. ඒ වගේම යල් පැන ගිය ජනතාවගේ අපේක්ෂාවන් ඉටුනොකරන ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් වෙනුවෙන් ජනවරමක් ඕනෑ. ඊළඟ ජනවරම අපි ඉල්ලන්නේ මේ රටට ජනතාවාදී ව්‍යවස්ථාවක් ලබාදීම වෙනුවෙනුයි. ජනතාවගේ ඇත්ත අපේක්ෂාවන් නියෝජනය කරන ව්‍යවස්ථාවක් ගෙන එන්න අවශ්‍යයි. වැරදි ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කර, නව ආර්ථිකයක් ගොඩනගන්න, කඩා වැටිවූ ආර්ථිකය ගොඩගන්න නව ආර්ථික උපායමාර්ගයක් ක්‍රියාවට නැගීමේ නව ජන බලයක් අවශ්‍යයි.

මේ වෙනුවෙන් රට තුළ ඉන්න ජනතාව පමණක් නොවෙයි, ලෝකය පුරාම ඉන්න ශ්‍රී ලාංකිකයන් අපි පෙළග ස්වනවා. ජාතික ජන බලවේගයේ නායකත්වය යටතේ දැනටමත් ලොව පුරා සිටින ශ්‍රී ලාංකිකයන් අරගල කරමින් සිටිනවා. ඒ නිසා අවසන් ජයග්‍රහණ ලබාග න්න ජාතික ජන බලවේගයෙන් සටන් පෙරමුණු ගෙනයනවා. 74වසරක සාපලත් පාලනය නිමාකර, ජනතා ජයග්‍රහණ ලබන පාලනයක් අපි පිහිටුවනවා. ඒ වෙනුවෙන් අපි සැමදෙනෙක්ම පෙළගැසෙමු.”

# අලුත් ආණ්ඩුවක් හදාගන්න පාර්ලිමේන්තුව විසුරුවා බැහැලා යන්න



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්

**ටිල්වින් සිල්වා සහෝදරයා**

මේ වන විට ආණ්ඩුව සිටින්නේ ‘අපායේ ඉන්ටර්වල්’ එකක බවත් වැඩි වෙලාවක් මෙවැනි ‘ඉන්ටර්වල්’ නොතිබෙනු ඇති බවත් ජාතික ජන බලවේගයේ නායකත්වයෙන් මෙම ‘ඉන්ටර්වල්’ ඉතා ඉක්මනින් අවසන් කර, ජනතාවාදී පාලනයක් පිහිටුවනු ලබන බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ජනතාව විසින් වත්මන් ආණ්ඩුව සහ ජනාධිපතිවරයා නොපිළිගන්නා බැවින් ජනතාව කැමති අලුත් ආණ්ඩුවක් හදාගැනීම සඳහා ජනවරමක් ලබාගැනීමට පාර්ලිමේන්තුව විසුරුවා ඉවත් වී යන ලෙස ආණ්ඩුවට අවධාරණය කරන්නේ යැයි කියා සිටියේය.

‘අරගලයේ ජන බලය’ රැලියේදී වැඩිදුරටත් අදහස් දක්වමින් ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

“සටන නැවත පටන් ගන්න ඕනෑ. දැවැන්ත අමාරුකම් මැද්දේ දස දහස් ගණන් ජනතාවක් නුගේගොඩට ඇවිත් සටන පටන් ගත්තේ ඒ නිසයි. මේ අරගලය කරන්නේ සතුරාට ශක්තිමත් වෙන්න, අවස්ථාව නොදෙන්නයි. මේ රටේ දේශපාලන බිමේ වාසිදායකම තත්වය තිබෙන්නේ ජාතික ජන බලවේගයටයි. සම්ප්‍රදායික ධනපති දේශපාලන පක්ෂ කැඩිලා බිඳිලා තිබෙන්නේ. අපි සූදානම් වෙන්නේ ආණ්ඩුවක් හදන්නයි; පොදු ජනයා සතුටින් තියන ජනතාවාදී පාලනයක් පිහිටුවන්නයි. ජාතික ජන බලවේගය විතරයි දෙපයින් නැගී සිටින්නේ. ජනතාව දෙපයින් සිටුවිය හැක්කේ ජාතික ජන බලවේගයට විතරයි. ජනතාවට අභිමානය, ගෞරවය දෙන්න පුළුවන් එකම පක්ෂය ජාතික ජන බලවේගය විතරයි.

දැන් ඒ හැමෝම ඡන්දවලට බයයි. ජාතික ජන බලවේගයත්, එහි නායක අනුර දිසානායක සහෝදරයත් රට හදන්න පුළුවන් පක්ෂය සහ නායකයා ලෙස දැනටමත් ජනතාව පිළිගෙන ඉවරයි. දැන් තිබෙන්නේ ජනතාවගේ ඒ කැමැත්ත බලයක් බවට පත්කර ගන්න අවස්ථාවක් ලබා ගැනීමයි. දැන් තිබෙන්නේ ජනතාවගේ යුගයක්. ජනතාව දැන් පෙළගැසෙන්නේ ආණ්ඩු එලවන්න විතරක් නොවෙයි. පරණ පාලනය නිමා කොට, අලුත් රටක්, නව සමාජයක්, නිර්මාණය කරන්නයි. ඒ වෙනුවෙන් සටන් පෙරමුණේ අත්වැල් බැඳගෙන සහෝදරත්වයෙන් අපි සටන් කරමු. ඒ සටන පීලි පන්නන්න ඉඩනොදී නිවැරදි ඉලක්කයට ගෙන යමු. මහා මැතිවරණයක් ඉක්මනින් දිනාගෙන අපේ රටේ ඉතිහාසයේ පළමු වතාවට ඇත්ත ජනතාවාදී පාලනයක් නිර්මාණය කර ගනිමු.”



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික

**එරංග ගුණසේකර සහෝදරයා**

# හොරා කෑ සල්ලි නැවත ලබාගැනීමට බලකිරීම රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක්ද?

ගෝල්ෆේස් අරගලකරුවන්ට පහරදී, අත්අඩංගුවට ගෙන ජන බලය ආපසු හැරවිය නොහැකි බව කී ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික එරංග ගුණසේකර සහෝදරයා, හොරාකාපු සල්ලි නැවත අත්පත්කර ගැනීමට අරගලකරුවන් විසින් බලකිරීම රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් වන්නේ කෙසේදැයි ප්‍රශ්න කර සිටියේය.

රැලියේදී තවදුරටත් අදහස් දැක්වූ එරංග සහෝදරයා මෙසේද පැවසීය.

“මැයි 09 වැනිදා සාමකාමී අරගලයට ප්‍රහාර එල්ල කිරීමෙන් පස්සේ සමහර අය ටිකක් ඉමු කියන සංවාදයකට ආවා. නමුත් ජාතික ජන බලවේගය රට පුරාම ජනතාව ඒකරාශී කරගෙන අරගලය ඉස්සරහට ගෙනියන්න අවශ්‍ය බලය පෙන්නුවා. අවසානයේ ජූලි 09වැනිදා ගෝඨාභය රාජපක්ෂ ගෙදර යන තැනට ජනතාව පෙළගැස්සුවා. අරගලකරුවෝ හැටියට අපි භූමිය අත්පත් කර ගැනීමේ උපක්‍රමය වෙනස් කර, නව බලයක් ගොඩනැගීම වෙනුවෙන් පෙළගැසෙමින් සිටිනවා. එය කළ හැක්කේ සංවිධානාත්මක, උපක්‍රමශීලී ජාතික ජන බලයට විතරයි කියලා නැවත වරක් ඔප්පු කර තිබෙනවා.

අද මුල පුරන්නේ නව පන්නයේ ජාතික විමුක්ති අරගලයකටයි. එයට එකතුවී සිටින ඔබ සැම ඓතිහාසිකයි. මර්දනය ගැනම බලාපොරොත්තු තියන රනිල් රාජපක්ෂට කළ හැකිව තිබෙන්නේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ වසන්ත මුදලිගේ, චින්තක ඇතුළු සහෝදර සහෝදරියන් අත්අඩංගුවට ගැනීම පමණයි. රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ චෝදනාවලින් අත්අඩංගුවට ගැනීමට උත්සාහ කිරීමක් විතරයි. හොරාකාපු සල්ලි නැවත අත්පත්කර ගැනීමට බලකිරීම රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක්ද කියලා අපි රනිල් රාජපක්ෂ කල්ලියෙන් අහනවා. එහෙම නම් ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ඒ කුමන්ත්‍රණයේ හවුල්කරුවන් බව ප්‍රකාශ කරවා. ඒ සියලු ජනතාව එකතු කර, ගෝඨාට එහා ගිය පාඩමක් රනිල් රාජපක්ෂට උගන්වන්න අපි සූදානම්.”


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.